# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# ANNUAL REPORT

# 2017

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**இலங்கை சனநாயக சோசலிசக்**

**குடியரசின் அரசாங்க சேவை**

**ஆணைக்குழு**

**PUBLIC SERVICE COMMISSION**
**OF**
**THE DEMOCRATIC SOCIALIST REPUBLIC**
**OF SRI LANKA**

# රාජ්‍ය සේවා කොමිෂන් සභාව

# වාර්ෂික වාර්තාව

# 2017


1200/9, රජමල්වත්ත පාර
බත්තරමුල්ල

| | | |
|---|---|---|
| **දුරකථන** | **-** | **0112136600 / 0112136650** |
| **ෆැක්ස්** | **-** | **0112876169 / 0112876181** |
| **ඊ මේල්** | **-** | **sec-psc@sltnet.lk / info@psc.gov.lk** |
| **වෙබ්** | **-** | **www.psc.gov.lk** |

මගේ අංකය: PSC/ADM/07/02/2017
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
අංක 1200/9
රජමල්වත්ත පාර
බත්තරමුල්ල

2018 ජූනි මස 18 දින.

මහ ලේකම්,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

මහත්මයාණෙනි,

**2017 ජනවාරි 01 දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා**
**කාල පරිච්ඡේදය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (5) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව 2017 ජනවාරි 01 දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව මේ සමඟ ඔබ වෙත එවමි.

මෙයට - විශ්වාසී,

එම්.ඒ.බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## දැක්ම

ජාතියේ විශිෂ්ටත්වය සඳහා කැපවූ රාජ්‍ය සේවයක්.

## මෙහෙවර

සාධාරණව, විනිවිද බවින් හා සමානුකූලව මහජනයාට සේවය කිරීමට, කාර්යක්ෂම, විනයගරුක සහ තෘප්තියට පත් රාජ්‍ය සේවයක් ස්ථාපනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

## 2017.01.01 – 2017.12.31 කාලය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින්

**සභාපති**

ඩී. දිසානායක මහතා

**සාමාජිකයින්**

ඩී.එස්. විජයතිලක මහත්මිය

ආචාර්ය පී. රාමනුජම් මහතා

වී. ජෙගරාසසිංගම් මහත්මිය

එස්.එන්. සෙනෙවිරත්න මහතා

එස්. රනුග්ගේ මහතා

ඩී.එල්. මෙන්ඩිස් මහතා

එස්.ඒ.සී.එස්.ඩබ්ලිව්. ජයතිලක මහතා

මහාචාර්ය ඒ.ජී. හුසයින් ඉස්මායිල් මහතා

## පටුන


| අනු අංකය | | කාරණය | පිටුව |
|---|---|---|---|
| 1 | හැඳින්වීම | | 01 |
| 2 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඓතිහාසික ගමන් මග | | 01 |
| 3 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල | | 03 |
| | 3.1 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ විමසුමට ලක්කළ හැකි අවස්ථා | 05 |
| 4 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳ පොදු සමාලෝචනය | | 05 |
| | 4.1 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු ඉටු කිරීමේදී මුහුණ දෙන අභියෝග හා ගැටළුවලට ලබා දී ඇති විසඳුම් | 07 |
| 5 | රාජ්‍ය සේවා කොමිෂන් සභා බලය අභිනියෝජනය කිරීමෙන් පසු අංශ වෙත පැවරී ඇති කාර්යයන් | | 08 |
| | 5.1 | ආයතන අංශය | 08 |
| | 5.1.1 | ආයතන අංශයෙහි කාර්ය භාරය | 09 |
| | 5.1.2 | ආයතන අංශයේ ප්‍රගතිය (2017.01.01 –2017.12.31) | 10 |
| | 5.2 | පත්කිරීම් අංශය | 13 |
| | 5.2.1 | පත්කිරීම් අංශයෙහි කාර්යභාරය | 14 |
| | 5.2.2 | පත්කිරීම් අංශයේ ප්‍රගතිය (2017.01.01 –2017.12.31) | 14 |
| | 5.3 | උසස්කිරීම් අංශය | 22 |
| | 5.3.1 | උසස්කිරීම් අංශයෙහි කාර්යභාරය | 22 |
| | 5.3.2 | උසස්කිරීම් අංශයේ ප්‍රගතිය (2017.01.01 –2017.12.31) | 23 |
| | 5.4 | විනය අංශය | 26 |
| | 5.4.1 | විනය අංශයෙහි කාර්යභාරය | 26 |
| | 5.4.2 | විනය අංශයේ ප්‍රගතිය (2017.01.01 –2017.12.31) | 28 |
| | 5.5 | අභියාචනා අංශය | 30 |
| | 5.5.1 | අභියාචනා අංශයේ කාර්යභාරය | 30 |
| | 5.5.2 | අභියාචනා අංශයේ ප්‍රගතිය (2017.01.01 –2017.12.31) | 31 |
| | 5.6 | පාලන අංශය | 32 |
| | 5.7 | මූල්‍ය අංශය | 33 |
| | 5.8 | අභ්‍යන්තර විගණන අංශය | 33 |
| 6 | අධ්‍යාපන සේවා කමිටුව | | 34 |
| | 6.1 | අධ්‍යාපන සේවා කමිටුවේ කාර්යභාරය | 34 |
| | 6.2 | අධ්‍යාපන සේවා කමිටුවේ ප්‍රගතිය (2017.01.01 – 2017.12.31) | 34 |
| 7 | සෞඛ්‍ය සේවා කමිටුව | | 35 |
| | 7.1 | සෞඛ්‍ය සේවා කමිටුවේ කාර්යභාරය | 35 |
| | .7.2 | සෞඛ්‍ය සේවා කමිටුවේ ප්‍රගතිය (2017.01.01 – 2017.12.31) | 36 |
| 8 | මුදල් ප්‍රතිපාදනය | | 38 |
| 9 | කාර්ය මණ්ඩලය | | 38 |
| | 9.1 | සංවිධාන සටහන | 38 |
| | 9.2 | කාර්ය මණ්ඩල සංයුතිය | 39 |
| | 9.3 | කාර්ය මණ්ඩල පුහුණු කටයුතු | 39 |
| 10 | 2017 වර්ෂය තුළ එක්එක් අංශය විසින් කරුණු ඉදිරිපත් කර ඇති නඩු ගණන | | 39 |
| 11 | කොමිෂන් සභා රැස්වීම් | | 39 |
| 12 | අමාත්‍යාංශමය හා දෙපාර්තමේන්තුමය රැස්වීම් | | 40 |
| 13 | ස්තූතිය | | 48 |
| | ඇමුණුම් | | 49 - 51 |

## 01. හැඳින්වීම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සංශෝධිත 54(1) අනු ව්‍යවස්ථාව අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් නව දෙනෙකුගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමන්විත වේ. ඒ සාමාජිකයින් අතුරින් සාමාජිකයින් තිදෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් රජයේ නිලධරයින් වශයෙන් අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති අය වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් එක් සාමාජිකයෙකු එහි සභාපතිවරයා ලෙස පත් කරනු ලැබේ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසු 2015.10.15 දින නව කොමිෂන් සභාව පත් කරන ලදී. රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2017 ජනවාරි 01 වන දින සිට 2017 දෙසැම්බර් 31 වන දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ඉටු කරන ලද කාර්යයන් පිළිබඳ මෙම වාර්තාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(5) අනු ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරයි.

## 02. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඓතිහාසික ගමන් මග

ශ්‍රී ලංකාව, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත් විජිතයක්ව පැවති සමයේ දී, වර්ෂ 1946 මැයි මස 15 දිනැති ලංකා (ආණ්ඩුක්‍රම) රාජාඥාව මගින් ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදී. එමගින්, රාජ්‍ය නිලධාරීන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරුකිරීම්, විනය පාලනය හා සේවයෙන් පහකිරීම් පිළිබඳ විධායක බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරා දෙන ලදී.

වර්ෂ 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව සම්මත වීමත් සමඟ, එතෙක් වසර විසි හයක් පුරා ක්‍රියාත්මක වූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව අහෝසි වූ අතර රාජ්‍ය සේවය පිළිබඳ අධිකාරි බලය අමාත්‍ය මණ්ඩලය වෙත පවරා දෙනු ලැබිණ.

වර්ෂ 1978 දී දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව ප්‍රතිෂ්ඨාපනය කරන ලද අතර, එම කොමිෂන් සභාව අභියාචනා බලධාරියා වශයෙන් පමණක් කටයුතු කරන ලදී. 1992 වර්ෂයේදී රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරීන්ගේ (ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ සිට ඉහළ තනතුරු හැර) පත්කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම පිළිබඳ විධායක බලතල අමාත්‍ය මණ්ඩලය විසින් පවරන ලද අභිනියෝජිත බලය ප්‍රකාරව මෙම කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලදී. කොමිෂන් සභාව හෝ එමගින් බලය අභිනියෝජිත කමිටුවක් විසින් ගනු ලබන තීරණ වෙනස් කිරීමට, අමුතු කිරීමට හෝ අවලංගු කිරීමට ඉඩ සැලසෙන බලතල අමාත්‍ය මණ්ඩලය වෙත රඳවා ගනු ලැබිණ.

වර්ෂ 2001 දී, 17වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින්, රාජ්‍ය සේවය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එතෙක් පැවති IX වන පරිච්ඡේදය පරිච්ජින්න කොට නව පරිච්ඡේදයක් ඇතුළත් කරන ලදි. ඒ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයන් නව දෙනෙකුට නොවැඩි සාමාජිකයින් සංඛ්‍යාවකගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමන්විත විය. ඒ සාමාජිකයින් අතුරින් සාමාජිකයින් තිදෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් රජයේ නිලධරයින් වශයෙන් අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති අය වූහ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් එම සාමාජිකයන් අතුරෙන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබුණි. මෙම සංශෝධනය මගින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තත්වය ප්‍රබල වෙනසකට භාජනය වූ අතර, ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, රාජ්‍ය සේවයේ පත්කිරීම්, උසස්කිරීම්, ස්ථානමාරු කිරීම හා විනය පාලනය කිරීම පිළිබඳ අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී තිබුණු බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරිණි. තවද මෙහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව පාර්ලිමේන්තුවට වගකීමට හා පිළිතුරු දීමට බැඳී සිටින ආයතනයක් බවට පත් කෙරිණි.

වර්ෂ 2010දී , 18වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ස්ථාපනය හා කර්තව්‍යයන්ට අදාළ කරුණු සංශෝධනය කරනු ලැබ ඇත. මෙය පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව පාර්ලිමේන්තුවට පිළිතුරු දිය යුතු කොමිෂන් සභාවකි. 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සංශෝධිත 54(1) අනු ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් නව දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමන්විත විය. ඒ සාමාජිකයින් අතුරින් සාමාජිකයින් තිදෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් රජයේ නිලධරයින් වශයෙන් අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති අය වූහ. ජනාධිපතිවරයා විසින් එම සාමාජිකයන් අතුරෙන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිණ. ඔවුහු තෙවසරක කාල පරිච්ඡේදයක් සඳහා ස්වකීය ධූර හෙබවූ අතර, තවදුරටත් එවැනි එක් කාල පරිච්ඡේදයක් සඳහා නැවත පත් කරනු ලැබීමට සුදුස්සන් විය.

18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සංශෝධිත 55(1) අනු ව්‍යවස්ථාව අනුව අමාත්‍ය මණ්ඩලය විසින් රජයේ නිලධරයන්ට අදාළ සියලු ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්විය යුත්තේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, පොලිස් නිලධාරීන් ද ඇතුළු ව රාජ්‍ය නිලධාරීන් පත්කිරීම, උසස්කිරීම, ස්ථාන මාරුකිරීම හා ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීම පිළිබඳ බලතල කොමිෂන් සභාව වෙත පැවරිණි.

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සංශෝධිත 54(1) අනු ව්‍යවස්ථාව අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත්

කරනු ලබන සාමාජිකයන් නව දෙනෙකුගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමන්විත වේ. ඒ සාමාජිකයින් අතුරින් සාමාජිකයින් තිදෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් රජයේ නිලධරයින් වශයෙන් අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති අය වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් එක් සාමාජිකයෙකු එහි සභාපතිවරයා ලෙස පත් කරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, රාජ්‍ය නිලධාරීන් පත්කිරීම, උසස්කිරීම, ස්ථාන මාරුකිරීම හා ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීම පිළිබඳ බලතල කොමිෂන් සභාව වෙත පවරා ඇත. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජාතික පොලිස් කොමිෂම හා විගණන කොමිෂන් සභාව පිහිටුවීමත් සමඟ පොලිස් නිලධාරීන් හා විගණන නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභා විෂය පථයෙන් ඉවත් කෙරිණි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56 (1) වගන්තියෙහි විධිවිධාන පරිදි අධ්‍යාපන සේවා කමිටුව හා සෞඛ්‍ය සේවා කමිටුව පිහිටුවා ඇත.

### 03. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල

19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පැවරී ඇති බලතල අනුව යුධ හමුදා, නාවික හමුදා හා ගුවන් හමුදා සාමාජිකයකු හෝ මැතිවරණ කොමිෂන් සභාව විසින් පත්කරන ලද මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරයකු හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පත්කරන ලද පොලිස් නිළධරයෙකු හෝ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද උපලේඛන ගත නිලධරයෙකු හෝ විගණන සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද ශ්‍රී ලංකා විගණන සේවයේ නිලධරයෙකු හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවලින් පත්කරන ලද පළාත් රාජ්‍ය සේවකයින්, ජනාධිපතිවරයා විසින් පත්කරන ලද අමාත්‍යංශ ලේකම් හා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානීන්, සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම්වල ආයතන සේවකයන්ද හැර පළාත් සභාවල සේවය කරන දීප ව්‍යාප්ත සේවාවලට ගැනෙන නිලධාරීන් ඇතුළු අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් ,

- පත්කිරීම
- උසස් කිරීම
- ස්ථාන මාරු කිරීම
- විනය පාලනය හා සේවයෙන් පහ කිරීම , රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරනු ලබයි.

අංක 1955/22 හා 2016.02.25 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් සංශෝධිත අංක 1941/41 හා 2015.11.20 දිනැති ගැසට් නිවේදනය මගින් සිදුකර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා බලතල පැවරීම අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006හි

අර්ථ නිරූපනය කර ඇති (අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ පළාත් රාජ්‍ය සේවයේ හා අධිකරණ නිලධාරීන් හැර) තෘතියික මට්ටමේ අධිශ්‍රේණියේ හා විශේෂ ශ්‍රේණියේ නිලධරයන් හැර අනිකුත් සියලුම නිලධාරීන්ද ප්‍රාථමික හා ද්විතීයික මට්ටමේ සියලුම නිලධාරීන් ද සම්බන්ධ පත් කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීමට අදාළ බලය අමාත්‍යාංශ ලේකම්වරුන්ට, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ට පවරා ඇත. රාජ්‍ය සේවයේ සියලුම නිලධාරීන් සම්බන්ධව ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වරදවල් සම්බන්ධව විනය පාලනය දෙපාර්තමේන්තු ප්‍රධානින්ට හෝ අමාත්‍යාංශ ලේකම්වරුන්ට පවරා ඇත.

අංක 1992/07 හා 2016.11.07 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් සංශෝධිත අංක 1989/29 හා 2016.10.19 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් බලතල පවරා ඇති අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ පත්කිරීම් , සේවය ස්ථිර කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, සේවය අවසන් කිරීම්, සේවයෙන් ඉල්ලා අස්වීම්, විශ්‍රාම ගැන්වීම් හා කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදීම සම්බන්ධ කටයුතු මෙන්ම සේවය හැරයාමේ නිවේදනයන්ට එරෙහිව ඉදිරිපත් වන අභියාචනා සම්බන්ධව සලකා බැලීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබා දීමේත්, ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම්වලට අදාළ ක්‍රියාමාර්ග ගැනිමේත් බලතල අධ්‍යාපන සේවා කමිටුව වෙත පවරා ඇත. මෙම කමිටුවේ නියමයකින් අතෘප්තියට පත් රාජ්‍ය නිලධාරියෙකුට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 58 ( 1 ) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලිඛිත අභියාචනයක් ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත.

අංක 1994/24 හා 2016.10.27 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් බලතල පවරා ඇති සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ පත්කිරීම් , සේවය ස්ථිර කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, සේවය අවසන් කිරීම්, සේවයෙන් ඉල්ලා අස්වීම්, විශ්‍රාම ගැන්වීම් හා කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදීම සම්බන්ධ කටයුතු මෙන්ම සේවය හැරයාමේ නිවේදනයන්ට එරෙහිව ඉදිරිපත් වන අභියාචනා සම්බන්ධව සලකා බැලීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබා දීමේත්, ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම්වලට අදාළ ක්‍රියාමාර්ග ගැනිමේත් බලතල සෞඛ්‍ය සේවා කමිටුව වෙත පවරා ඇත. මෙම කමිටුවේ නියමයකින් අතෘප්තියට පත් රාජ්‍ය නිලධාරියෙකුට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 58 ( 1 ) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලිඛිත අභියාචනයක් ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත.

එසේ වුවද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරන ලද යම් බලතල පැවරීමකට අයත් විෂය පථය සම්බන්ධයෙන් හෝ එකී කොමිෂන් සභාව විසින් එලෙස සිදු කරන ලද යම් බලතල පැවරීමක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් හෝ ඇතිවිය හැකි අවිනිශ්චිත තත්වයකදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තිරණය අවසානාත්මක හා තිරණාත්මක විය යුතුවේ.

### 3.1 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ විමසුමට ලක්කළ හැකි අවස්ථා

පහත සඳහන් අවස්ථාවන්හි දී හැරුණ විට කොමිෂන් සභාවේ තීරණ කිසිදු අධිකරණයකදී හෝ විනිශ්චය සභාවකදී මත විමසුමකට ලක්කළ නොහැකිය.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61 අ ව්‍යවස්ථාව අනුව 126 ව්‍යවස්ථාවේ (1) වන, (2) වන, (3) වන, (4) වන හා (5) වන ඡේදයන්හි විධිවිධානයන්ට යටත්ව, මූලික අයිතිවාසිකම් වෙනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පැමිණිලි කිරීම.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 59(1) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව හා 2002 අංක 4 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය පනතින් ස්ථාපනය කරන ලද පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනය කිරීම.

## 04. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳ පොදු සමාලෝචනය

රාජ්‍ය සේවයේ විධායක මට්ටමේ සේවාවන් සඳහා බඳවා ගැනීමේදී එක් එක් සේවාවන් සඳහා සුවිශේෂී වූ දැනුම, කුසලතාවය, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සහිත පුද්ගලයන් අදාළ සේවා ව්‍යවස්ථාවන් හා බඳවා ගැනීම් පටිපාටිවලට අනුගතව සාධාරණව හා අපක්ෂපාතීව බඳවා ගැනීමට කටයුතු කර ඇත. නිසිකලට විධිමත්ව බඳවා ගැනීම් සිදු කිරීමට හැකි වන පරිදි සේවා ව්‍යවස්ථා, බඳවා ගැනීම් පටිපාටි සැකසීම මගින් රාජ්‍ය සේවයේ වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන දැනුම හා කුසලතාවය හෙබි තරුණ පිරිසක් විධායක මට්ටමේ සේවාවන් සඳහා බඳවා ගැනීමට හැකියාව ලැබුණි.

ISO 9001:2008 ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව තත්ත්ව කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කර පවත්වාගෙන යාමෙන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් පිරිනමන ISO 9001:2008 ජාත්‍යන්තර ප්‍රමිති සහතිකය රාජ්‍ය සේවා කොමිෂන් සභාව ලබා ඇති බැවින් තවදුරටත් තත්ත්ව කළමනාකරණ පද්ධතිය තුළ අඛණ්ඩ වැඩිදියුණු කිරීම් නිරන්තරයෙන් සිදු කිරීමටත්, හඳුන්වා දී ඇති කාල නිර්නායක හා වැඩ අදියර අනුව සාධාරණ කාල රාමු තුළ වඩාත් ක්‍රමවත්ව නිරවද්‍යව හා කඩිනම්ව කාර්යයන් නිම කිරීමටත් හැකියාව ලැබී ඇත. සේවාලාභී ප්‍රඥප්තියක් සකස් කිරීමෙන් හා කාර්යයන් සඳහා නිශ්චිත ඉලක්ක ලබා දීමෙන් කාර්යක්ෂමතාව තවදුරටත් වර්ධනය කර ඇත.

පෙර වර්ෂ වලදී මෙන්ම මෙම වර්ෂයේද අමාත්‍යාංශ ලේකම්වරු හා පාලන කටයුතු භාර අතිරේක ලේකම්වරු කැඳවා පෙර වර්ෂයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමග රාජකාරි කිරීමේදි මුහුණ දීමට සිදු වූ ගැටළු පිළිබඳ සමාලෝචනයක් කර කාර්යයන් කඩිනම් කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී.

නිශ්චිත කාල රාමුවක් තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග ලබා ගැනිමට හා ඒවා ක්‍රියාත්මක කිරීමට නිලධාරින්ට ඉලක්ක ලබා දෙමින් ක්‍රමවත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට හැකි විය

අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් තොරතුරු ගෙන්වා ගැනීමේදී ඇතිවන ප්‍රමාදයන් අවම කර ගනිමින් සේවා අපේක්ෂිත රාජ්‍ය නිලධාරින්ට කඩිනම් සේවයක් සැලසීම සඳහා විධිමත්ව සිහිකැඳවීම් කරමින් හා ලිපි හුවමාරු අවම වන පරිදි සාකච්ඡා පැවැත්වීමෙන් කටයුතු කාර්යක්ෂමව කිරීමට පියවර ගන්නා ලදී.

රාජ්‍ය සේවයේ විධායක මට්ටමේ සේවාවන් වල උසස් කිරීම් සිදු කිරීමේදී එක් එක් සේවාවන් සඳහා සුවිශේෂී වූ දැනුම් කුසලතාවය වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සහිත පුද්ගලයන් අදාළ උසස් කිරීමේ පටිපාටිවලට අනුගතව විනිවිදභාවයෙන් යුක්තව උසස් කිරීමට කටයුතු කර ඇත. අප්‍රමාදව උසස් කිරීම් සිදුකිරීම මගින් රාජ්‍ය නිලධාරීන් තුළ අභිප්‍රේරණය ඇති කිරීමෙන් ගුණාත්මක හා සඵලදායී රාජ්‍ය සේවයක් පවත්වා ගැනීමට ක්‍රියා කර ඇත.

බලය අභිනියෝජිත බලධරයෙකුගේ නියමයකින් අතෘප්තියට පත් රාජ්‍ය නිලධාරීන් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 58 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන ලිඛිත අභියාචනා සම්බන්ධයෙන් පවත්නා නීතිමය ප්‍රතිපාදන තුළ යුක්තිගරුක, සාධාරණ හා අපක්ෂපාතී තීරණ ලබා දීම මගින් රාජ්‍ය නිලධරයන්ගේ අභියාචන අවස්ථා සුරක්ෂිත කිරීම සිදු කරන ලදී.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය මණ්ඩලය තුළ විවිධ ජාතීන්ට හා විවිධ ආගම්වලට අයත් නිලධාරීන් සේවයේ නියුතුව සිටින බැවින් ජාතීන් අතර සමගිය හා ආගමික සංහිඳියාව ඇතිවන අයුරින් සිංහල හා දෙමළ අළුත් අවුරුදු උත්සවයද, වෙසක් උත්සවය සඳහා ධර්ම දේශනාවක්ද, රාමලාන් උත්සවය සඳහා ඉස්ලාම් ආගමික මව්ලවිතුමකුගේ ප්‍රධානත්වයෙන් දේශනයක් ද දීපාවලී උත්සවය සඳහා හින්දු පූජකවරයෙකුගේ ප්‍රධානත්වයෙන් පූජාවක් ද නත්තල් උත්සවය සඳහා කතෝලික පූජකවරයෙකු ගේ සහභාගීත්වයෙන් දේශනයක් ද පවත්වන ලදී. කාර්ය මණ්ඩලයේ සියළුම නිලධාරීන්ගේ සුභසාධනය සඳහා වාර්ෂික විනෝද චාරිකාව මෙම වර්ෂය තුළදීත් ඉතා සාර්ථකව පැවැත්වීමට හැකියාව ලැබුණි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අයත් බත්තරමුල්ලෙහි පිහිටි නව කාර්යාලයීය ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු 2014 ජනවාරි මස 02 දින ආරම්භ කර ඇත. එම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් වසර තුනක (03) ගිවිසුම් කාලයෙන් පසු 2017.06.22 දින වැඩ අවසන් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත භාරදීමට නියමිතව පැවතිණ. මෙම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන මුදල රු. 432, 335, 423/- ක් වන අතර 2017.12.31 දින වන විට රු 300,423,239.61 ක් ගෙවීම් කර ඇත.

වැඩබිම තුළ ඇතිවූ තාක්ෂණික දෝශ හා අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ව්‍යාපෘති කළමනාකරුවන ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් වසින් 2018.01.04 දින දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරන ලදී.

2017 වර්ෂය සඳහා කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරනු ලැබූ බිල්පත් සඳහා ප්‍රමාණවත් මුදල් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් නොකිරීම මත ගෙවීම් කටයුතු සහ ඉදිකිරීම් නිම කිරීමේ කටයුතු ප්‍රමාද වී ඇත.

## 4.1 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු ඉටු කිරීමේදී මුහුණ දුන් අභියෝග හා ගැටළුවලට ලබා දී ඇති විසදුම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන බඳවා ගැනීමේ පටිපාටි හා සේවා ව්‍යවස්ථා සැකසීම, පත්කිරීම්, උසස්කිරීම්, විනය හා අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී විවිධාකාර රාජකාරිමය ගැටළු පැන නැගීම නිසා ඇති වන ප්‍රමාදයන් වැළැක්වීමට අදාළ ආයතන වල නිලධාරීන් සමග අවශ්‍ය අවස්ථාවන්හීදී රැස්වීම් පවත්වා විසඳුම් ලබා ගැනීමට කටයුතු කරන ලදී. ඊට අමතරව කඩිනම් පිළිතුරු ගෙන්වා ගැනීම සඳහා අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවලට සිහි කැඳවීම් යැවීමටද කටයුතු කර ඇත.

එක් එක් අංශයන්හී ඇති කාර්යයන් විෂය භාර නිලධාරීන් අතර බෙදී යාමේ විෂමතාවයන් අවම කරමින් විෂය රාජකාරි නැවත පැවරීම තුලින් කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව වැඩිකර ගැනීමට කටයුතු කල අතර රාජ්‍ය සේවා කොමිෂන් සභාව තුළ දීර්ඝ කාලයක් සේවය කළ අත්දැකීම් බහුල නිලධාරීන් ස්ථාන මාරු වීම නිසාත්, පැමිණි නවක නිලධාරීන්ට අත්දැකීම් ලබා ගැනීමට කාලයක් ගතවන නිසාත් ඔවුන් පුහුණු වීම් සඳහා සම්බන්ධ කිරීමෙන් හා ඔවුන්ගේ පසු විපරම් කටයුතු විධිමත් කිරීමෙන් අවශ්‍ය සේවාව කාර්යක්ෂමව ලබා ගත හැකි විය.

ඇතැම් සේවාවන්වලට අදාළ සේවා ව්‍යවස්ථාවන්හී පැවති ගැටළුකාරී තත්ත්වයන් නිරාකරණය කර ගනිමින් ඒ ඒ සේවාවල පැවති පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරන ලදී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණයකින් අතෘප්තියට පත් පුද්ගලයින් විසින් පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය විසින් ලබා දෙන ක්‍රියාත්මක කල නොහැකි තීරණ හා වැරදි සහගත අවස්ථාවන් ආශ්‍රිතව ගැටළුකාරී තත්ත්වයන් ඇතිවීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මුහුණදෙන එක් බාධකයක් ලෙස දැක්විය හැක.

කෙසේ වෙතත් 2017 වර්ෂය තුළ ඉටු කරන ලද සමස්ථ කාර්යයන් සම්බන්ධව සැළකීමේදී අභියෝග අවස්ථාවක් කර ගනිමින් හා ගැටළු පැහැදිලිව විශ්ලේෂණය කර ඒවා නිරාකරණය කර ගනිමින් කාර්ය මණ්ඩලයේ කැපවීමත් අන්‍යෝන්‍ය සහයෝගයත් මත රාජ්‍ය සේවයේ සාර්ථකත්වය කරා ගමන් කිරීමට හැකියාව ලද වසරකි.

## 05. රාජ්‍ය සේවා කොමිෂන් සභා බලය අභිනියෝජනය කිරීමෙන් පසු අංශ වෙත පැවරී ඇති කාර්යයන්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමට පහත සඳහන් අංශයන් ස්ථාපිත කොට අවශ්‍ය දායකත්වය ලබා ගෙන ඇත.

- ආයතන අංශය
- පත්කිරීම් අංශය
- උසස්කිරීම් අංශය
- විනය අංශය
- අභියාචනා අංශය
- පාලන අංශය
- ගිණුම් අංශය
- අභ්‍යන්තර විගණන අංශය

### 5.1 ආයතන අංශය

අංක 1941/41 හා 2015.11.20 දිනැති ගැසට් නිවේදනය මගින් සිදු කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා බලතල පැවරීම අනුව රාජ්‍ය සේවයේ අනුමත සෑම සේවාවකටම සේවා ව්‍යවස්ථාවක්ද, එම සේවාවන්ගෙන් පරිබාහිර වන්නා වූ අනුමත සෑම තනතුරකටම බඳවා ගැනීමේ පටිපාටියක්ද සකස් කිරීම ආයතන අංශය මගින් සිදු කරයි.

එම සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීම් පටිපාටි සකස් කිරීමේදී, අනුමත සෑම තනතුරකටම නිලධාරීන් බඳවා ගැනීමේදී අනුගමනය කළ යුතු බඳවා ගැනීමේ ක්‍රමය, බඳවා ගැනීමේ සුදුසුකම්, තනතුරට අදාළ වැටුප් පරිමාණය, සේවා නියමයන් හා කොන්දේසි, උසස් කිරීමේ ක්‍රමවේද සහ අදාළ අනෙකුත් සියලු විස්තර ඇතුළත් කිරීම සිදු කරයි. අදාළ සේවා ව්‍යවස්ථාව හෝ බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීමට ප්‍රථම තනතුරු අනුමත කිරීම සම්බන්ධව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියද, වැටුප් පරිමාණය සම්බන්ධයෙන් වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශයද, සේවා ව්‍යවස්ථාව හෝ බඳවා ගැනීමේ පටිපාටි කෙටුම්පත සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල් ගේ නිර්දේශයද ලබා ගනී.

### 5. 1. 1 ආයතන අංශයෙහි කාර්යභාරය


- රාජ්‍ය සේවයේ අනුමත සෑම සේවකටම සේවා ව්‍යවස්ථාවක් සකස් කිරීමේ කටයුතු.
- එම සේවාවන්ගෙන් පරිබාහිර වන්නා වූ අනුමත සෑම තනතුරකටම බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කිරීමේ කටයුතු
- රාජ්‍ය සේවා කොමිෂන් සභා විෂය පථයට අයත් බලතල පැවරීමට අදාළ කටයුතු.
- රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති පදනම් කරගත් උපදෙස් මාලා සකස් කිරීමේ කටයුතු
- සියලුම සේවාවන් සඳහා ස්ථාන මාරු පටිපාටි සකස් කිරීම සහ සංශෝධනය කිරීමේ කටයුතු
- අනුමත කරන ලද සේවා ව්‍යවස්ථාවක්, බඳවා ගැනීමේ පටිපාටියක් හෝ ස්ථාන මාරු පටිපාටියක් සංශෝධනය කිරීමට අවශ්‍ය වුවහොත් අදාළ ලේකම්වරයාගේ නිර්දේශය මත එම ව්‍යවස්ථාව හෝ පටිපාටිය සංශෝධනය කිරීමේ කටයුතු
- බලය අභිනියෝජිත බලධරයන් විසින් කරනු ලබන පත්කිරීම්, උසස් කිරීම්වලට අදාළව පැන නගින ගැටළුවලට විසඳුම් ලබා ගැනිම සඳහා එවනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ලබා දීමේ කටයුතු
- රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, සේවා ව්‍යවස්ථා, බඳවා ගැනීමේ පටිපාටි, ස්ථාන මාරු පටිපාටි, චක්‍රලේඛ සහ නියෝග වලින් බැහැරව කටයුතු කිරීමට සිදුවන අවස්ථා වලදී ඒ සම්බන්ධයෙන් පැන නගින ගැටළුවලට විසඳුම් ලබා දීමේ කටයුතු
- 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අදාළ කටයුතු

### 5. 1. 2 ආයතන අංශයේ ප්‍රගතිය (2017.01.01 –2017.12.31)

| අනු අංකය | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | නව බඳවාගැනීමේ පටිපාටි | 64 |
| 2 | නව සේවා ව්‍යවස්ථා | 01 |
| 3 | බඳවාගැනීමේ පටිපාටි සංශෝධන | 62 |
| 4 | සේවා ව්‍යවස්ථා සංශෝධන | 33 |
| 5 | ස්ථානමාරු පටිපාටි | 08 |
| 6 | ස්ථානමාරු පටිපාටි සංශෝධන | 15 |
| 7 | උසස්කිරීම් පටිපාටි | 12 |
| 8 | චක්‍රලේඛ | 04 |
| 9 | සේවා ව්‍යවස්ථාවල නිවැරදි කිරීම් | 01 |
| 10 | විශේෂ අවස්ථාවන්හිදී බඳවාගැනීමේ පටිපාටිවලින් බැහැර වීම් සම්බන්ධව කෙරෙන ඉල්ලීම් | 26 |
| 11 | විශේෂ අවස්ථාවන්හිදී සේවා ව්‍යවස්ථාවලින් බැහැර වීම් සම්බන්ධව කෙරෙන ඉල්ලීම් | 11 |
| 12 | පරිපාලන බලතල පැවරීම | 09 |
| 13 | ප්‍රතිපත්ති සම්බන්ධ කටයුතු | 141 |
| 14 | පොදු කරුණු | 168 |
| 15 | ශ්‍රේෂ්ඨාධිකරණය, පරි.අභි.විනි.අධිකාරිය, අභියාචනාධිකරණය සම්බන්ධ කරුණු | 43 |
| | **එකතුව** | **598** |

**වගුව අංක** 01

### ආයතන අංශයේ ප්‍රගතිය
### (2017.01.01 – 2017.12.31)




**රූපසටහන අංක 01**

### 2017.01.01 සිට 2017.12.31 දක්වා අනුමත කරන ලද බඳවාගැනීමේ පටිපාටි පිළිබඳ විස්තර

| අනු අංකය | අමාත්‍යාංශය | අනුමත කරන ලද බ.ගැ.ප. |
|---|---|---|
| 1 | මුදල් හා ජනමාධ්‍ය | 02 |
| 2 | සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය | 03 |
| 3 | ස්වදේශ කටයුතු | 01 |
| 4 | නීතිය හා සාමය සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ | 01 |
| 5 | කර්මාන්ත හා වාණිජ කටයුතු | 01 |
| 6 | නිවාස හා ඉදිකිරීම් | 01 |
| 7 | විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති | 01 |
| 8 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු | 01 |

| | | |
|---|---|---|
| 9 | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචිකිරීම් හා හින්දු ආගමික කටයුතු | 01 |
| 10 | මහවැලි සංවර්ධන හා පරිසර | 01 |
| 11 | කාන්තා හා ළමා කටයුතු | 02 |
| 12 | අධිකරණ | 01 |
| 13 | අධ්‍යාපන | 06 |
| 14 | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු | 02 |
| 15 | සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන | 02 |
| 16 | ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ | 01 |
| 17 | ක්‍රීඩා | 01 |
| 18 | කෘෂිකර්ම | 02 |
| 19 | ප්‍රවාහන හා ගුවන් සේවා | 06 |
| 20 | ප්‍රාථමික කර්මාන්ත | 01 |
| 21 | තිරසාර සංවර්ධන හා වන ජීවී | 02 |
| 22 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 01 |
| 23 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 01 |
| 24 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ | 02 |
| 25 | කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන | 01 |
| 26 | වැවිලි කර්මාන්ත | 08 |
| 27 | විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් | 01 |
| 28 | පළාත් සභා හා පළාත් පාලන | 01 |
| 29 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ | 02 |
| 30 | සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු | 01 |
| 31 | විශේෂ කාර්යභාර | 01 |
| 32 | ආරක්ෂක | 02 |
| 33 | ප්‍රාදේශීය සංවර්ධන | 03 |
| 34 | වරාය හා නාවික කටයුතු | 01 |
| | **එකතුව** | **64** |

**වගුව අංක 02**

**<u>2017 වර්ෂයේ අනුමත කරන ලද සේවා ව්‍යවස්ථා - (01)</u>**

1. රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාව

**<u>2017 වර්ෂයට අදාළව නිකුත් කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ - (04)</u>**

1. 01/2017 තනතුරුවලට ස්ථිර පදනම මත / වැඩ බැලීමේ පදනම මත/ රාජකාරි ඉටු කිරීමේ පදනම මත නිලධාරීන් පත් කිරීමේදී තොරතුරු ඉදිරිපත් කිරීම
2. 02/2017 රජයේ ස්වේච්ඡා බල හමුදාව හෝ ස්වේච්ඡා උප සේවයේ සේවය සඳහා නිලධාරියෙකු රාජ්‍ය සේවයෙන් මුදා හැරීම

3. 03/2017 රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සේවයෙන් පරිබාහිර වෙනත් තනතුරක් භාර ගැනීම සඳහා පූර්ව තනතුරෙන් විධිමත් පරිදි ඉවත් වූ නිලධාරියෙකු නැවත පූර්ව තනතුර සඳහා පැමිණීම

4. 04/2017 රාජ්‍ය සේවයේ නිලධාරීන් පුහුණු කාලයක් සහිත රාජ්‍ය සේවයේ නව තනතුරක් භාර ගැනීම සඳහා මුදාහැරීම

**<u>2017 වර්ෂයේ සකස් කරන ලද ස්ථානමාරු පටිපාටි - (08)</u>**

1. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තියේ ස්ථානමාරු පටිපාටිය
2. ශ්‍රී ලංකා විගණන සේවයේ ස්ථානමාරු පටිපාටිය
3. අනධ්‍යන කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය
4. ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්ගේ/සහකාරවරුන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය
5. ඒකාබද්ධ තැපැල් සේවාවේ විධායක හා මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ගේ මාරුකිරීම් පටිපාටිය
6. ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුවේ ප්‍රජා විශෝධන නිලධාරීන්ගේ, වැඩ පරීක්ෂකවරුන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය
7. ශ්‍රී ලංකා තක්සේරු සේවයේ සහකාර දිස්ත්‍රික් තක්සේරුකරු iii/ii හා iii/i ස්ථාන මාරු පටිපාටිය
8. ශ්‍රී ලංකා වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ ස්ථාන මාරු පටිපාටිය

### 5.2 පත්කිරීම් අංශය

අංක 1955/22 හා 2016.02.25 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධිත අංක 1941/41 හා 2015.11.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ ඇත්තා වූද, 1989/29 හා 2016.01.29, 1990/24 හා 2016.10.27, 1992/7 හා 2016.11.07 යන අති විශේෂ ගැසට් පත්‍රයන්හී පළකරනු ලැබ ඇත්තා වූද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පවරා නොමැති, රාජ්‍ය නිලධාරීන් (අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ පළාත් රාජ්‍ය සේවයේ හා අධිකරණ නිලධාරීන් හැර) සම්බන්ධයෙන් වන පත්කිරීම් පිළිබඳ පහත දැක්වෙන කර්තව්‍යයන් පත්කිරීම් අංශය මගින් ඉටු කරනු ලැබේ.

### 5.2.1 පත්කිරීම් අංශයෙහි කාර්යභාරය


අනුමත සේවා ව්‍යවස්ථා/බඳවා ගැනිම් පටිපාටි/උසස්කිරීම් පටිපාටි අනුව බඳවා ගැනීම, සේවයේ ස්ථිර කිරීම, සේවය අවසන් කිරීම, කලින් දැරූ තනතුරට පෙරළා යැවීම, වැඩ බැලීමේ/රාජකාරි ඉටු කිරීමේ පදනම මත පත් කිරීම (ප්‍රාදේශීය ලේකම් හැර), මුදාහැරීම (ස්ථිර/තාවකාලික), කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම, සේවයෙන් ඉල්ලා අස්වීම, සේවයට/තනතුරට නැවත පත්කිරීම, විශ්‍රාම ගැන්වීම (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/88 අනුව, වෛකල්පිත, අනිවාර්ය, වෛද්‍ය හේතූන් මත), විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම, සේවා ව්‍යවස්ථාවන්හි උප ලේඛනගත තනතුරුවලට (අදාළ අවස්ථාවන්හිදී) පත්කිරීම, මාණ්ඩලික නිලධාරීන්ගේ පත්කිරීම්වලට අදාළව සෞඛ්‍ය සේවා කමිටුවෙන් හා අධ්‍යාපන සේවා කමිටුවෙන් පනවනු ලැබ ඇති තීරණවලට එරෙහි අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම පත්කිරීම් අංශය මගින් සිදුවේ.

ඉහත සඳහන් කර්තව්‍යයන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලැබ ඇති නියෝග/තීරණවලට එරෙහිව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව මෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයෙහි හා අභියාචනාධිකරණයෙහි ගොනු කරනු ලබන නඩු අයදුම්පත් සම්බන්ධයෙන් නිරීක්ෂණ හා අවශ්‍ය වාර්තාවන් ඉදිරිපත් කිරීම, මහජන පෙත්සම් කාරක සභාව, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්, මානව හිමිකම් කොමිෂන් සභාව වෙත අවශ්‍ය නිරීක්ෂණ වාර්තා සැපයීම ද පත්කිරීම් අංශය මගින් සිදුකෙරේ.

### 5.2.2. පත්කිරීම් අංශයේ ප්‍රගතිය (2017.01.01 – 2017.12.31)

| අනු අංකය | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | විශ්‍රාම ගැන්වීම් | 466 |
| 2 | ස්ථිර කිරීම් | 681 |
| 3 | බඳවා ගැනීම් | 404 |
| 4 | කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම් | 959 |
| 5 | කොන්ත්‍රාත් පදනම මත පත්කිරීම් | 21 |
| 6 | කාර්යක්ෂමතා කඩඉම් සම්බන්ධ තීරණ | 905 |
| 7 | වැඩ බැලීමට / රාජකාරි ඉටුකිරීමට පත්කිරීම් | 1054 |
| 8 | මුදාහැරීම් | 90 |
| 9 | ඉල්ලා අස්වීම් | 18 |
| 10 | අන්තර්ග්‍රහණය කිරීම් | 1150 |
|  | එකතුව | **5748** |

**වගුව අංක 03**




**රූපසටහන අංක 02**

| අනු අංකය | විශ්‍රාම ගැන්වීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අධ්‍යාපන අමාත්‍යාංශය | 01 |
| 02 | අධිකරණ අමාත්‍යාංශය | 02 |
| 03 | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 03 |
| 04 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව | 01 |
| 05 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 03 |
| 06 | ආරක්ෂක අමාත්‍යාංශය | 01 |
| 07 | ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 24 |
| 08 | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය | 02 |
| 09 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 04 |
| 10 | ක්‍රීඩා අමාත්‍යාංශය | 01 |
| 11 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 42 |
| 12 | ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය | 13 |
| 13 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | 08 |
| 14 | තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය | 15 |

| | | |
|---|---|---|
| 15 | තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය | 04 |
| 16 | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය | 02 |
| 17 | නිපුනතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 19 |
| 18 | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | 06 |
| 19 | ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය | 01 |
| 20 | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | 03 |
| 21 | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | 02 |
| 22 | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | 01 |
| 23 | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | 91 |
| 24 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 189 |
| 25 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 02 |
| 26 | විගණකාධිපති දෙපාර්තමේන්තුව | 04 |
| 27 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 04 |
| 28 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 18 |
| | එකතුව | 466 |

**වගුව අංක 04**

| අනු අංකය | ස්ථිර කිරීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අධ්‍යාපන අමාත්‍යාංශය | 02 |
| 02 | අධිකරණ අමාත්‍යාංශය | 10 |
| 03 | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 01 |
| 04 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව | 02 |
| 05 | ආරක්ෂක අමාත්‍යාංශය | 04 |
| 06 | ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 13 |
| 07 | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය | 01 |
| 08 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 15 |
| 09 | ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 02 |
| 10 | බුද්ධශාසන අමාත්‍යාංශය | 01 |
| 11 | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය | 04 |
| 12 | ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය | 23 |
| 13 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | 07 |
| 14 | ජාතික සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය | 01 |

| | | |
|---|---|---|
| 15 | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | 01 |
| 16 | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | 104 |
| 17 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 01 |
| 18 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 17 |
| 19 | විගණකාධිපති දෙපාර්තමේන්තුව | 47 |
| 20 | විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 01 |
| 21 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 06 |
| 22 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 54 |
| 23 | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය | 82 |
| 24 | ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවය | 64 |
| 25 | ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය | 79 |
| 26 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 73 |
| 27 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 62 |
| 28 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය | 04 |
| | එකතුව | 681 |

**වගුව අංක 05**

| අනු අංකය | බඳවා ගැනීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 01 |
| 2 | අධිකරණ අමාත්‍යාංශය | 36 |
| 3 | ආරක්ෂක අමාත්‍යාංශය | 01 |
| 4 | ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 35 |
| 5 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 15 |
| 6 | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය | 05 |
| 7 | ජාතික සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය | 01 |
| 8 | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 02 |
| 9 | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | 01 |
| 10 | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්තාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | 01 |
| 11 | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | 20 |
| 12 | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | 02 |

| | | |
|---|---|---|
| 13 | මුදල් අමාත්‍යාංශය | 39 |
| 14 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 22 |
| 15 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 03 |
| 16 | ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවය | 63 |
| 17 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 133 |
| 18 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 24 |
| | එකතුව | 404 |

**වගුව අංක 06**

| අනු අංකය | කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 01 |
| 02 | අභ්‍යන්තර කටයුතු , වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 01 |
| 03 | ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 42 |
| 04 | කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය | 03 |
| 05 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 06 |
| 06 | ක්‍රීඩා අමාත්‍යාංශය | 01 |
| 07 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 11 |
| 08 | තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය | 07 |
| 09 | තිරසාර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය | 01 |
| 10 | නිපුනතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 02 |
| 11 | නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය | 02 |
| 12 | නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය | 17 |
| 13 | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | 308 |
| 14 | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ , පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | 03 |
| 15 | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | 06 |
| 16 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 159 |
| 17 | වාර්මාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 05 |
| 18 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 01 |
| 19 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 383 |
| | එකතුව | 959 |

**වගුව අංක 07**

| අනු අංකය | කොන්ත්‍රාත් පදනම මත පත්කිරීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 04 |
| 2 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 06 |
| 3 | තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය | 01 |
| 4 | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | 06 |
| 5 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 01 |
| 6 | වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය | 03 |
| | **එකතුව** | **21** |

**වගුව අංක 08**

| අනු අංකය | මුදා හැරීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අධිකරණ අමාත්‍යාංශය | 02 |
| 02 | ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 03 |
| 03 | කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය | 01 |
| 04 | නිපුනතා සංවර්ධන හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය | 01 |
| 05 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | 01 |
| 06 | බන්ධනාගාර ප්‍රතිසංස්කරන, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | 01 |
| 07 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 79 |
| 08 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 02 |
| | **එකතුව** | **90** |

**වගුව අංක 09**

| අනු අංකය | කාර්යක්ෂමතා කඩඉම් සම්බන්ධ තීරණ | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අධ්‍යාපන අමාත්‍යාංශය | 02 |
| 02 | අධිකරණ අමාත්‍යාංශය | 01 |
| 03 | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය | 26 |
| 04 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 05 |
| 05 | ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය | 13 |
| 06 | ජාතික ප්‍රතිපත්ති හා අර්ථික කටයුතු අමාත්‍යාංශය | 05 |
| 07 | තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය | 02 |
| 08 | තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය | 14 |
| 09 | නිපුනතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 50 |
| 10 | නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය | 02 |
| 11 | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | 02 |
| 12 | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්තාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | 20 |
| 13 | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | 52 |

| | | |
|---|---|---|
| 14 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 548 |
| 15 | රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය | 05 |
| 16 | වනිතා හා ළමා කටයුතු අමාත්‍යාංශය | 12 |
| 17 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 01 |
| 18 | විගණකාධිපති දෙපාර්තමේන්තුව | 03 |
| 19 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 09 |
| 20 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | 01 |
| 21 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 02 |
| 22 | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය | 03 |
| 23 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 04 |
| 24 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 32 |
| 25 | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය | 63 |
| 26 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 08 |
| 27 | සමාජ සවිබල ගැන්වීම්, සුභ සාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය | 18 |
| 28 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 02 |
| | **එකතුව** | **905** |

**වගුව අංක 10**

| **අනු අංකය** | **වැඩ බැලීමට / රාජකාරි ඉටු කිරීමට පත්කිරීම්** | **සංඛ්‍යාව** |
|---|---|---|
| 01 | අධ්‍යාපන අමාත්‍යාංශය | 07 |
| 02 | අධිකරණ අමාත්‍යාංශය | 04 |
| 03 | ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 08 |
| 04 | කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය | 08 |
| 05 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 03 |
| 06 | ක්‍රීඩා අමාත්‍යාංශය | 05 |
| 07 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 71 |
| 08 | ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය | 15 |
| 09 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | 25 |
| 10 | ජාතික සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය | 02 |
| 11 | තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය | 36 |
| 12 | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 16 |
| 13 | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | 11 |
| 14 | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | 02 |
| 15 | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | 53 |
| 16 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 648 |

| | | |
|---|---|---|
| 17 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 07 |
| 18 | සමාජ සවිබල ගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය | 02 |
| 19 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 130 |
| 20 | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 01 |
| | **එකතුව** | **1054** |

**වගුව අංක 11**

| **අනු අංකය** | **ඉල්ලා අස්වීම්** | **සංඛ්‍යාව** |
|---|---|---|
| 01 | ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 04 |
| 02 | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 01 |
| 03 | ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය | 01 |
| 04 | මුදල් අමාත්‍යාංශය | 01 |
| 05 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 11 |
| | **එකතුව** | **18** |

**වගුව අංක 12**

| **අනු අංකය** | **අන්තර්ග්‍රහණය කිරීම්** | **සංඛ්‍යාව** |
|---|---|---|
| 01 | අමාත්‍යමණ්ඩල කාර්යාලය | 01 |
| 02 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව | 16 |
| 03 | ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 79 |
| 04 | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය | 53 |
| 05 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 02 |
| 06 | මුදල් කොමිෂන් සභාව | 01 |
| 07 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 02 |
| 08 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 174 |
| 09 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 02 |
| 10 | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය | 01 |
| 11 | ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය | 22 |
| 12 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 374 |
| 13 | සමාජ සවිබල ගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය | 423 |
| | **එකතුව** | **1150** |

**වගුව අංක 13**

### 5.3 උසස් කිරීම් අංශය

අංක 1955/22 හා 2016.02.25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධිත අංක 1941/41 හා 2015.11.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ ඇත්තාවූද, 1989/29 හා 2016.01.29, 1990/24 හා 2016.10.27, 1992/07 හා 2016.11.07 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයන්හි පළ කරනු ලැබ ඇත්තා වූද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල වෙනත් අභිනියෝජිත බලධරයෙකු වෙත පවරා නොමැති, රාජ්‍ය නිලධාරීන් (අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ පළාත් රාජ්‍ය සේවයේ හා අධිකරණ නිලධාරීන් හැර) සම්බන්ධයෙන් වන තනතුරකට පත්කිරීම් / උසස් කිරීම් පිළිබඳ පහත දැක්වෙන කර්තව්‍යයන් උසස් කිරීම් අංශය මගින් ඉටු කරනු ලැබේ.

### 5.3.1 උසස්කිරීම් අංශයෙහි කාර්යභාරය


එක් එක් සේවාවන් හෝ නිලධර කාණ්ඩ සඳහා අනුමත සේවා ව්‍යවස්ථා, බඳවා ගැනීම් පටිපාටි, උසස්කිරීම් පටිපාටි අනුව ශ්‍රේණියෙන් ශ්‍රේණියට සිදුකරන උසස් කිරීම් මෙන්ම ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත තරඟකාරී විභාග, ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මගින් තෝරාගැනීම් මත සිදුකරනු ලබන උසස්කිරීම්, ජ්‍යෙෂ්ඨතාවය මත, ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත මෙන්ම උසස්කිරීම් මත නිලධාරීන් අදාළ තනතුරුවලට පත්කිරීම්, දීප ව්‍යාප්ත සේවාවන්හී 1 වන ශ්‍රේණියේ හා ඉන් ඉහල ශ්‍රේණිවල නිලධාරීන් තනතුරකින් තනතුරකට ස්ථානමාරු කිරීමේදී ඊට පූර්ව අනුමැතිය ලබා දී අදාළ නව තනතුරට පත්කිරීම්, ප්‍රාදේශීය ලේකම් තනතුරට පත්කිරීම (ස්ථිර/ වැඩ බැලීමට/ රාජකාරි ඉටු කිරීමට), මාණ්ඩලික නිලධාරීන්ගේ උසස්කිරීම්වලට අදාළව සෞඛ්‍ය සේවා කමිටුවෙන් හා අධ්‍යාපන සේවා කමිටුවෙන් දෙන තීරණවලට එරෙහි අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම උසස්කිරීම් අංශයෙන් සිදුවේ.

එමෙන්ම ඉහත සඳහන් කර්තව්‍යයන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලැබ ඇති නියෝග/තීරණවලට එරෙහිව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව මෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයෙහි හා අභියාචනාධිකරණයෙහි ගොනු කරනු ලබන නඩු අයදුම්පත් සම්බන්ධයෙන් නිරීක්ෂණ හා අවශ්‍ය වාර්තා ඉදිරිපත් කිරීම, මහජන පෙත්සම් කාරකසභාව, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්), මානව හිමිකම් කොමිෂන් සභාව වෙත අවශ්‍ය නිරීක්ෂණ වාර්තා සැපයීම සම්බන්ධව ද කටයුතු කරනු ලැබේ.

5.3.2 2017 වසරේ උසස් කිරීම් අංශයේ ප්‍රගතිය (2017.01.01 - 2017.12.31)

| අනු අංකය | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීම් | 1134 |
| 2 | තෝරාගැනීම් මත උසස් කිරීම් | 213 |
| 3 | තනතුරුවලට පත්කිරීම් | 366 |
| 4 | වැඩ බැලීමට, රාජකාරි ඉටු කිරීමට පත්කිරීම් (ප්‍රාදේශීය ලේකම්) | 43 |
| | **එකතුව** | **1756** |

වගුව අංක14




රූප සටහන අංක 03

| අනු අංකය | ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ආරක්ෂක අමාත්‍යාංශය | 04 |
| 2 | ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 01 |
| 3 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 06 |
| 4 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | 05 |
| 5 | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 01 |
| 6 | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | 314 |
| 7 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 06 |

| | | |
|---|---|---|
| 8 | විගණකාධිපති දෙපාර්තමේන්තුව | 06 |
| 9 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 31 |
| 10 | සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය | 01 |
| 11 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 14 |
| 12 | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය | 09 |
| 13 | ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවය | 07 |
| 14 | ශ්‍රී ලංකා කාෂිකාර්මික සේවය | 71 |
| 15 | ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය | 173 |
| 16 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 293 |
| 17 | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය | 86 |
| 18 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය | 01 |
| 19 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 74 |
| 20 | ශ්‍රී ලංකා සත්ත්ව නිශ්පාදන හා සෞඛ්‍ය සේවය | 31 |
| | **එකතුව** | **1134** |

**වගුව අංක 15**

| අනු අංකය | තෝරාගැනීම් මත උසස්කිරීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අධිකරණ අමාත්‍යාංශය | 06 |
| 02 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 08 |
| 03 | ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 04 |
| 04 | කම්කරු හා වෘත්තිය පුහුණු අමාත්‍යාංශය | 01 |
| 05 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 52 |
| 06 | ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය | 09 |
| 07 | තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය | 02 |
| 08 | නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය | 04 |
| 09 | ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය | 43 |
| 10 | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචිකිරීම් හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | 03 |
| 11 | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | 08 |
| 12 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 67 |
| 13 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 01 |
| 14 | විගණකාධිපති දෙපාර්තමේන්තුව | 01 |
| 15 | සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය | 01 |
| 16 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 03 |
| | **එකතුව** | **213** |

**වගුව අංක 16**

| අනු අංකය | තනතුරුවලට පත්කිරීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණ කොමිෂන් සභා ලේකම් | 01 |
| 02 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 16 |
| 03 | අතිරේක ප්‍රධාන තක්සේරුකරු | 01 |
| 04 | අතිරේක ලේකම් | 49 |
| 05 | අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් | 01 |
| 06 | අතිරේක සාමාන්‍යාධිකාරී | 01 |
| 07 | අධ්‍යක්ෂ | 30 |
| 08 | අධ්‍යක්ෂ ජනරාල් | 01 |
| 09 | ආනයන අපනයන පාලක | 01 |
| 10 | ආයුර්වේද කොමසාරිස් | 01 |
| 11 | ආගමන හා විගමන පාලක | 04 |
| 12 | කොමසාරිස් | 02 |
| 13 | ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් | 01 |
| 14 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සහකාර අධ්‍යක්ෂ | 01 |
| 15 | ජ්‍යෙෂ්ඨ පාංශු ප්‍රස්ථාරක | 01 |
| 16 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 28 |
| 17 | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 02 |
| 18 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 05 |
| 19 | නියෝජ්‍ය රේගු අධිකාරී | 02 |
| 20 | නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරු | 02 |
| 21 | නියෝජ්‍ය විගණකාධිපති | 02 |
| 22 | නීති නිලධාරී | 02 |
| 23 | පළිබෝධනාශක පාලනය කිරීමේ රෙජිස්ට්‍රාර් | 01 |
| 24 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 09 |
| 25 | ප්‍රධාන ගණකාධිකාරී | 14 |
| 26 | ප්‍රධාන මූල්‍ය නිලධාරී | 06 |
| 27 | ප්‍රධාන ඉංජිනේරු | 01 |
| 28 | ප්‍රාදේශීය ලේකම් | 58 |
| 29 | බන්ධනාගාර කොමසාරිස් | 03 |
| 30 | ගබඩා අධිකාරී | 01 |
| 31 | විශේෂ වන පාලක | 20 |
| 32 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ තනතුරුවලට පත්කිරීම් | 05 |
| 33 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ තනතුරුවලට පත්කිරීම් | 23 |

| | | |
|---|---|---|
| 34 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් | 27 |
| 35 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ තනතුරුවලට පත්කිරීම් | 12 |
| 36 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවලට පත්කිරීම් | 28 |
| 37 | සහකාර විගණකාධිපති | 04 |
| | **එකතුව** | **366** |

**වගුව අංක 17**

### 5.4 විනය අංශය

2016.10.19 දිනැති අංක 1989/27, 1989/28, 1989/29 හා 2016.11.07 දිනැති අංක 1992/7 දරණ අති විශේෂ ගැසට් නිවේදන අනුව අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන නිලධාරින්ගේ හා 2016.10.27 දිනැති අංක 1990/24, 1990/25 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුව සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ වන නිලධාරින් හැර අංක 1955/22 හා 2016.02.25 හා 2016/37 හා 2017.04.26 දිනවලින් සංශෝධිත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පැවරීම දැක්වෙන අංක 1941/41 හා 2015.11.20 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයේ සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විෂය පථයට අයත් නිලධාරීන්ගේ විනය කටයුතු මෙම අංශය මගින් සිදු කරනු ලැබේ. විනය අංශය වෙත ලැබෙන සියලුම ලිපි ලේඛන පිළිබඳව සවිස්තරාත්මකව කරුණු අධ්‍යයනය කර අපක්ෂපාතී තීරණ ගැනීම සඳහා නිරවුල්ව, එම කරුණු සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කරමින් අවශ්‍ය සහයෝගය ලබා දෙයි.

#### 5.4.1 විනය අංශයෙහි කාර්යභාරය

5.4 ඡේදයේ සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විනය පාලනයට යටත් නිලධාරීන්ගේ විනය සම්බන්ධයෙන් කටයුතු කිරීම.

**(1) විනය කටයුත්තක් සම්බන්ධයෙන්**

I. දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් හෝ අමාත්‍යාංශ ලේකම්වරුන් මගින් සිදු කරන ලද මූලික විමර්ශන වාර්තාවක් විනය අංශයට ලැබීමෙන් අනතුරුව එය පිළිබඳව නිසි අධ්‍යයනයක් සිදු කොට අදාළ තොරතුරු, ලිපිලේඛන, නිරීක්ෂණ හා නිර්දේශ සම්පූර්ණ කරගැනීමෙන් පසුව වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව චෝදනා පත්‍ර නිකුත් කිරීම හෝ නොකිරීම පිළිබඳ සුදුසු තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත.

II. චෝදනා පත්‍රයක් නිකුත් කිරීමට තීරණය කළහොත් එම චෝදනා පත්‍රය අදාළ නිලධාරියාට පරිපාලන බලධරයා හා අමාත්‍යංශ ලේකම් හා දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් භාර දීමට කටයුතු කරනු ලබන අතර එම චෝදනා පත්‍රයට චූදිත නිලධාරියා විසින් ඉදිරිපත් කරනු ලබන පිළිතුර සහ ඒ සම්බන්ධව අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහ අමාත්‍යංශ ලේකම්ගේ හා පරිපාලන බලධරයාගේ නිරීක්ෂණ හා නිර්දේශ සැලකිල්ලට

ගනිමින් විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳ තීරණයක් ගනු ඇත.

III. විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට තීරණය කළහොත් ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන පරීක්ෂණ නිලධාරීන්ගේ සංචිතයෙන් සුදුසු නිලධාරියෙකු පරීක්ෂණ නිලධාරී ලෙස පත්කර එම විධිමත් විනය පරීක්ෂණය සිදු කරන ලෙස නියම කරනු ලැබේ. යම් හෙයකින් විධිමත් විනය පරීක්ෂණයක් නොපැවැත්වීමට තීරණය කළහොත් චූදිත නිලධාරියා විසින් ඉදිරිපත් කර ඇති පිළිතුර හා ඒ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහ අදාළ අමාත්‍යංශ ලේකම්ගේ හා පරිපාලන බලධරයාගේ නිරීක්ෂණ හා නිර්දේශ පදනම් කර ගනිමින් චූදිත නිලධාරියා සියලු චෝදනා වලින් නිදහස් කිරීම හෝ සුදුසු විනය දඬුවමක් පැනවීම හෝ සිදු කරනු ලබයි.

IV. විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වුණි නම් එම පරීක්ෂණයේ වාර්තාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලැබුණ පසු එම විධිමත් විනය පරීක්ෂණයේ දී ඉදිරිපත් වූ සියලුම වාචික හා ලිඛිත සාක්ෂි ද පරීක්ෂණ නිලධාරිගේ , පැමිණිල්ල මෙහෙයවීමේ නිලධාරිගේ සහ රැකවරණ නිලධාරිගේ වාර්තාවන් ද සැලකිල්ලට ගනිමින් චූදිත නිලධාරියා සියලු චෝදනාවලින් නිදහස් කිරීම හෝ චෝදනා එකකට, කිහිපයකට හෝ සියල්ලටම වරදකරු කොට සුදුසු විනය නියෝගයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලැබේ.

V. තවද විනය ක්‍රියාපටිපාටියේ කොටසක් වශයෙන් කිසියම් චූදිත නිලධාරියෙක් වැඩ තහනමට ලක්කිරීම හෝ එවැනි වැඩ තහනමේ පසුවන නිලධාරියෙකු නැවත සේවයේ පිහිටුවීම හෝ අනිවාර්ය නිවාඩු මත තැබීම හෝ නොනිමි විනය කරුණු පවතිද්දී අදාළ නිලධාරියා විශ්‍රාම ගන්වන්නේ නම් එකී විශ්‍රාම ගැන්වීම විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වන වගන්තියට යටත් කිරීම හෝ සිදු කරනු ලැබේ.

**(02) අධ්‍යාපන සේවා කමිටුව විසින් සහ සෞඛ්‍ය සේවා කමිටුව විසින් ලබා දෙන විනය නියෝගවලට අදාළව කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන්**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57(1) වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව 2016.10.19 දිනැති අංක 1989/27, 1989/28, 1989/29 හා 2016.11.07 දිනැති අංක 1992/7 දරණ අති විශේෂ ගැසට් නිවේදන අනුව අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන නිලධාරීන්ට අධ්‍යාපන සේවා කමිටුව විසින් සහ 2016.10.27 දිනැති අංක 1990/24 , 1990/25 හා සහ 2017.02.01 දිනැති අංක 2004/49 දරණ අති විශේෂ ගැසට් නිවේදන අනුව සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ වන නිලධාරීන්ට සෞඛ්‍ය සේවා කමිටුව විසින් පනවනු ලබන විනය නියෝගයන්ට එරෙහිව එම නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනාවල සඳහන් කරුණු ද එම අභියාචනා සම්බන්ධයෙන් අදාළ කමිටුව විසින් සහ එම නිලධාරීන්ගේ

පරිපාලන බලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන නිරීක්ෂණ හා නිර්දේශ ද සැලකිල්ලට ගෙන එකී නිලධාරීන් වෙත සහන සැලසීම/අභියාචනා ප්‍රතික්ෂේප කිරීම සිදු කරනු ලැබේ.

**(03) සේවය හැරයාමේ නිවේදනවලට එරෙහි අභියාචනා සම්බන්ධයෙන්**

2016.10.19 දිනැති අංක 1989/27, 1989/28, 1989/29 හා 2016.11.07 දිනැති අංක 1992/7 දරණ අති විශේෂ ගැසට් නිවේදන අනුව අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන නිලධාරීන්ගේ හා 2016.10.27 දිනැති අංක 1990/24 , 1990/25 දරණ අති විශේෂ ගැසට් නිවේදන අනුව සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ වන නිලධාරීන්ගේ හැර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පැවරීම දැක්වෙන 2016.02.25 දිනැති අංක 1955/22 හා 2017.04.26 දිනැති අංක 2016/37 ගැසට් නිවේදන මගින් සංශෝධිත අංක 1941/41 හා 2015.11.20 දිනැති ගැසට් නිවේදනයේ සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විෂය පථයට අයත් නිලධාරීන්ගේ සේවය හැරයාමේ නිවේදනවලට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනාවල සඳහන් කරුණු සහ එම අභියාචනා සම්බන්ධයෙන් එම නිලධාරීන්ගේ පරිපාලන බලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන නිරීක්ෂණ හා නිර්දේශ ද සැලකිල්ලට ගෙන එකී නිලධාරීන් සුදුසු පරිදි නැවත සේවයේ පිහිටුවීම/නොපිහිටුවීම සිදු කරනු ලැබේ.

**(04) උපරිමාධිකරණ, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය, මානව හිමිකම් කොමිසම, පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව සහ ඔම්බුඩ්ස්මන් වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන්**


කොමිෂන් සභාව විසින් පනවනු ලබන විනය නියෝගවලට හෝ එවැනි විනය කටයුතු පිළිබඳ තීරණයන්ට එරෙහිව උපරිමාධිකරණයට ගොනු කරනු ලබන අයදුම්පත් සම්බන්ධයෙන් නිරීක්ෂණ සැකසීම, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත, පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව වෙත සහ ඔම්බුඩ්ස්මන් වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් නිරීක්ෂණ සැකසීම හා අභියාචනා කැඳවනු ලබන දිනවලදී එම ආයතනයන්හි පෙනී සිටීම ද මානව හිමිකම් කොමිසම විසින් කරනු ලබන විමසීම් සම්බන්ධයෙන් සුදුසු පරිදි ක්‍රියා කිරීම ද කරනු ලැබේ.

**5.4.2 විනය අංශයේ ප්‍රගතිය - (2017.01.01 – 2017.12.31)**

| අනු අංකය | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | චෝදනා පත්‍ර නිකුත් කිරීම | 28 |
| 02 | චෝදනා පත්‍ර සංශෝධනය කිරීම | 09 |
| 03 | චෝදනාවලින් නිදහස් කිරීම | 15 |
| 04 | අනෙකුත් විනය දඬුවම් | 36 |
| 05 | නැවත සේවයේ පිහිටුවීම | 10 |
| 06 | අභියාචනා ප්‍රතික්ෂේප කිරීම | 21 |
| 07 | වි.වැ.ව්‍ය.සං.12 වැනි වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වීම | 07 |
| 08 | වැඩ තහනම් කිරීම | 06 |

| | | |
|---|---|---|
| 09 | සේවයෙන් පහ කිරීම් | 03 |
| 10 | සේවයෙන් විශ්‍රාම ගැන්වීම් | 07 |
| 11 | අනිවාර්ය විශ්‍රාම ගැන්වීම් | 01 |
| 12 | අධිකරණ අයදුම්පත් සඳහා නිරීක්ෂණ | 09 |
| 13 | විනය පරීක්ෂණ නිලධාරීන් පත් කිරීම | 24 |
| 14 | විනය හේතු මත විශ්‍රාම ගැන්වීම සාමාන්‍ය විශ්‍රාම ගැන්වීමක් බවට පරිවර්තනය කිරීම | 04 |
| 15 | විනය කටයුතු අවසන් කිරීම් | 21 |
| 16 | අනිකුත් සාමාන්‍ය නියෝග | 196 |
| 17 | පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරයේ අභියාචනා සඳහා නිරීක්ෂණ | 100 |
| | **එකතුව** | **497** |

**වගුව අංක 18**




**රූපසටහන අංක 04**

2017.01.01 දින සිට 2017.12.31 දින දක්වා කටයුතු කරමින් පැවති ශ්‍රේෂ්ඨාධිකරණ නඩු, අභියාචනාධිකරණ නඩු හා පරිපාලන අභියාචන විනිශ්චය අධිකාර අභියාචනා ප්‍රමාණය පහතින් දක්වා ඇත.

| | |
|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත් | - 08 |
| අභියාචනාධිකරණ අයදුම්පත් | - 10 |
| පරිපාලන අභියාචන විනිශ්චය අධිකාර අභියාචනා | - 134 |

### 5.5 අභියාචනා අංශය

බලය අභිනියෝජිත බලධරයකුගේ නියමයකින් අතෘප්තියට පත් රාජ්‍ය නිලධාරින් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 58 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන ලිඛිත අභියාචනා සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහාත්, එම අභියාචනා සම්බන්ධයෙන් නියමිත කාල රාමුව තුළදී තීරණ ලබා දීම සඳහාත් කොමිෂන් සභාවට සහය ලබා දීම අභියාචනා අංශය මගින් සිදු කරයි.

#### 5.5.1 අභියාචනා අංශයේ කාර්යභාරය

i. එක් එක් අභියාචනය සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව වෙතින් නිරීක්ෂණ හා නිර්දේශ ඇතුළත් වාර්තා කැඳවීම.

ii. ඉන් පසුව එක් එක් අභියාචනය සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම.

iii. අභියාචනා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදෙන තීරණ අභියාචක වෙත හා අනෙකුත් අදාළ පාර්ශවයන් වෙත දැනුම් දීම.

iv. අභියාචනා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදෙන තීරණවලට එරෙහිව, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා නිරීක්ෂණ වාර්තා සකස් කිරීම සහ එම අභියාචනා විභාගයට ගන්නා අවස්ථාවේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් එම අධිකාරය ඉදිරියේ පෙනී සිටීම.

v. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ සම්බන්ධයෙන් මහජන පෙත්සම් කාරක සභාව වෙත යොමු කරනු ලබන පෙත්සම්වලට අදාළව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

vi. මහජන පෙත්සම් කාරක සභාව විසින් විභාගයට ගනු ලබන පෙත්සම් සම්බන්ධයෙන් එම කාරක සභාව ඉදිරියේ පෙනී සිටීම.

vii. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තිරණාවලට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය හා අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ /නිර්දේශ ඉදිරිපත් කිරීම.

viii. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ සම්බන්ධයෙන් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත යොමු කරනු ලබන පෙත්සම්වලට අදාළව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.


ix. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන අයදුම්පත්වලට අදාළව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

x. ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ නඩු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව වෙත තොරතුරු ඉදිරිපත් කිරීම.

### 5.5.2 අභියාචනා අංශයේ ප්‍රගතිය (2017.01.01 – 2017.12.31)

| අනු අංකය | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | වර්ෂය තුළ ලැබුණු අභියාචනා | 1116 |
| 02 | වාර්තා ලැබී නොමැති අභියාචනා | 551 |
| 03 | වාර්තා ලැබී කටයුතු කරමින් පවතින අභියාචනා | 175 |
| 04 | 2017 වර්ෂය තුළ වාර්තා ලැබී එම වර්ෂය තුළදීම කටයුතු නිමකළ අභියාචනා ගණන | 1010 |
| 05 | පෙර වර්ෂය තුළ ලැබී 2017 වර්ෂය තුල කටයුතු නිම කළ අභියාචනා ගණන | 240 |
| 06 | දැනට පවතින ශ්‍රේෂ්ඨාධිකරණ නඩු ගණන (පෙර වර්ෂයන්ද ඇතුළත්ව) | 40 |
| 07 | දැනට පවතින අභියාචනාධිකරණ නඩු ගණන (පෙර වර්ෂයන්ද ඇතුළත්ව) | 05 |
| 08 | දැනට පවතින පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාර නඩු ගණන (පෙර වර්ෂයන්ද ඇතුළත්ව) | 214 |
| 09 | මහජන පෙත්සම් කාරක සභාවේ විමසීම් ගණන | 19 |

වගුව අංක 19




**රූප සටහන අංක 05**

### 5.6 පාලන අංශය

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ සාමාන්‍ය පරිපාලන කටයුතු පාලන අංශය වෙත පැවරී ඇත. අතිරේක ලේකම් (පාලන හා මූල්‍ය) මෙම අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි.

පාලන අංශය පහත සඳහන් කාර්යභාරය මෙහෙයවනු ලබයි

- ආයතනය වෙත ලැබෙන සියලුම ලිපි තොරතුරු කළමනාකරණ පද්ධතිය හරහා අංශ අතර බෙදා හැරීම
- ආයතනයේ කාර්ය මණ්ඩලයේ සියලුම පරිපාලන කටයුතු
- කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්බන්ධ කටයුතු
- ආයතනයේ කාර්යභාරය හා ප්‍රගතිය පිළිබඳව කාර්තු වශයෙන් හා වාර්ෂිකව පාර්ලිමේන්තුව වෙත වාර්තා ඉදිරිපත් කිරීම
- සේවාලාභීන් වෙනුවෙන් මහජන හමුවීම් සම්බන්ධීකරණය කිරීම
- ආයතනයට අයත් වාහනවලට අදාළ සියලු පරිපාලන කටයුතු

- ගොඩනැගිල්ලේ නඩත්තු කටයුතු හා ආරක්ෂක සේවය සම්බන්ධ කටයුතු
- අනුමත සේවක සංඛ්‍යාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාමට කටයුතු කිරීම හා නව තනතුරු ඇති කිරීම සම්බන්ධ කටයුතු

**5.7 මූල්‍ය අංශය**

මෙම අංශය කොමිෂන් සභා කාර්යාලය සඳහා නිර්බාධ මූල්‍ය තොරතුරු ප්‍රවාහයක් සහ කළමනාකරණ පද්ධතියක් සහතික වෙමින් මූල්‍යමය සේවා සපයයි. ඒ සඳහා පහත ක්‍රියාකාරකම් සපුරාලනු ලැබේ.

- කොමිෂන් සභා කාර්යාලය සඳහා මූල්‍ය සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- භාණ්ඩ හා සේවා සැපයීම
- ස්ථාවර වත්කම් කළමනාකරණය
- මූල්‍යමය කරුණු සම්බන්ධව මාර්ගෝපදේශනය සහ උපදේශනය
- ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වන ලේකම්වරයාට මූල්‍ය අංශයේ කටයුතු පිළිබඳව යාවත්කාලීන තොරතුරු සැපයීම
- අංශ අතර මූල්‍ය කටයුතු සම්බන්ධීකරණය
- ප්‍රසම්පාදන කටයුතු ඉටු කිරීම

**5. 8. අභ්‍යන්තර විගණන අංශය**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ සෘජු අධීක්ෂණය යටතේ ස්ථාපිත කර ඇති මෙම අංශය මගින් 2017 වර්ෂය තුළ පහත දැක්වෙන කාර්යභාරය ඉටු කර ඇත.

ආයතන තුළ ඵලදායී කාර්ය සාධනයක් හා සාර්ථක අභ්‍යන්තර පාලන ක්‍රමයක් තහවුරු කිරීම පිණිස,

- මූල්‍ය විගණනය
- පද්ධති විශ්ලේෂණය හා කාර්ය සාධන විශ්ලේෂණය කෙරෙහි අවධානය යොමු කරමින් වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙළ කිරීමත් ඒ අනුව ආයතනයේ සියළුම අංශ ආවරණය වනසේ අඛණ්ඩව වසර පුරා අභ්‍යන්තර විගණන කාර්යයන් ක්‍රියාත්මක කිරීම
- අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කිරීම
- විගණන කළමනාකරණ කමිටු රැස්වීම් කැඳවීම හා පැවැත්වීම මගින් කළමනාකරණ තිරණ ගැනීමේදී ප්‍රයෝජනවත් තොරතුරු ඉදිරිපත් කිරීම තුළින් ඉහළ කළමනාකරණයට අවශ්‍ය සහයෝගය ලබා දීම

## 6. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56 (1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීම අනුව අධ්‍යාපන සේවා කමිටුව පිහිටුවීම සඳහා අංක 1989/29 හා 2016.10.19 දිනැති ගැසට් පත්‍රයෙහි පළකර ඇත. එහි "ආ" උපලේඛනයේ බලතල පැවරීමට අදාළ විධිවිධාන 2016.10.20 දින සිට බල පැවැත්වෙන පරිදි අංක 1992 හා 2016.11.07 දිනැති සංශෝධන ගැසට් පත්‍රයේ සහ අංක 2014/3 හා 2017.04.11 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළකර ඇති අතර ඒ අනුව අධ්‍යාපන සේවා කමිටුව විසින් අදාළ කාර්යයන් ඉටු කරනු ලැබේ.


### 6.1 අධ්‍යාපන සේවා කමිටුවේ කාර්යභාරය

ඉහත සඳහන් බලතල පැවරීම ප්‍රකාරව කමිටුව වෙත ඉදිරිපත් වන කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීම මෙම කමිටුවේ කාර්යභාරය වේ.

### 6.2 අධ්‍යාපන සේවා කමිටුවේ ප්‍රගතිය ( 2017.01.01 – 2017.12.31 )

| අනු අංකය | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | චෝදනාපත්‍ර නිකුත් කිරීම | 11 |
| 02 | විනය කරුණු සම්බන්ධ සාමාන්‍ය නියෝග | 48 |
| 03 | ස්ථිර කිරීම් | 171 |
| 04 | චෝදනා පත්‍ර සංශෝධනය කිරීම | 02 |
| 05 | මුදා හැරීම් | 111 |
| 06 | අවසන් විනය නියෝග ලබා දීම | 21 |
| 07 | උසස් කිරීම | 246 |
| 08 | වැඩ තහනම් කිරීම | 09 |
| 09 | විශ්‍රාම ගැන්වීම් | 437 |
| 10 | වි.වැ.ව්‍ය.සංග්‍රහයේ 12 වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වීම | 11 |
| 11 | බඳවා ගැනීම් | 543 |
| 12 | විනය ක්‍රියාමාර්ග අවසන් කිරීම | 04 |
| 13 | අන්තර්ග්‍රහණය කිරීම | 730 |
| 14 | විනය පරීක්ෂණ නිලධාරීන් පත් කිරීම | 17 |
| 15 | විනය හේතු මත විශ්‍රාම ගැන්වීම සාමාන්‍ය විශ්‍රාම ගැන්වීමක් බවට පරිවර්තනය කිරීම | 03 |
| 16 | අනුයුක්ත කිරීම | 12 |
| 17 | කාර්යක්ෂමතා කඩඉම් සහන සම්බන්ධ තීරණ | 96 |
| 18 | නැවත සේවයේ පිහිටුවීම | 08 |
| 19 | තනතුරුවලට පත්කිරීම | 23 |
| 20 | රාජකාරි ආවරණයට පත් කිරීම | 09 |
| 21 | පත්කිරීම්, උසස්කිරීම් සම්බන්ධ අනෙකුත් නියෝග | 62 |
| 22 | කොන්ත්‍රාත් පදනම මත පත්කිරීම | 06 |
| 23 | දේශපාලන පළිගැනීම් සහන සම්බන්ධ නියෝග | 1037 |
| 24 | අභියාචනා | 06 |
| 25 | දේශපාලන පළිගැනීම් සහන සම්බන්ධ අනෙකුත් නියෝග | 04 |
| | එකතුව | 3627 |

වගුව අංක 20




**රූප සටහන අංක 06**

## 7. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව

අංක 2004/49 හා 2017.02.01, අංක 2009/18 හා 2017.03.08, දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධිත අංක 1990/24 හා 2016.10.27 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් 2016.11.01 දින සිට බලපැවැත්වෙන පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සෞඛ්‍ය සේවා කමිටුව වෙත බලතල පවරා ඇති අතර අංක 1990/20 හා 2016.10.27 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2016.10.27 දින සිට ක්‍රියාත්මක වන පරිදි එම කමිටුව සඳහා සාමාජිකයින් පත් කර ඇත.

### 7.1 සෞඛ්‍ය සේවා කමිටුවේ කාර්යභාරය


ඉහත සඳහන් බලතල පැවරීම ප්‍රකාරව කමිටුව වෙත ඉදිරිපත් වන කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීම මෙම කමිටුවේ කාර්යභාරය වේ.

## 7.2 සෞඛ්‍ය සේවා කමිටුවේ ප්‍රගතිය ( 2017.01.01 – 2017.12.31 )

| අනු අංකය | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | විශ්‍රාම ගැන්වීම් | 314 |
| 02 | ස්ථිර කිරීම් | 1041 |
| 03 | බඳවාගැනීම් | 3546 |
| 04 | 2017 වර්ෂයට පෙර රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරන ලද මෙතෙක් විධිමත් පත්වීම් ලිපි නිකුත් කර නොමැති වෛද්‍යවරුන් වෙත පත්වීම් ලිපි නිකුත් කිරීම | 570 |
| 05 | කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් | 173 |
| 06 | උසස්කිරීම් | 2498 |
| 07 | තනතුරුවලට පත්කිරීම් | 16 |
| 08 | විශේෂ ශ්‍රේණියට පත්කිරීම් | 161 |
| 09 | මුදාහැරීම් | 68 |
| 10 | ස්ථාන මාරුකිරීම් | 4060 |
| 11 | කාර්යක්ෂමතා කඩඉම් සහන සම්බන්ධ තීරණ | 182 |
| 12 | ඉල්ලා අස්වීම් | 22 |
| 13 | වැඩ බැලීම් | 49 |
| 14 | පත්වීම්වලට අදාළ අනෙකුත් නියෝග | 16 |
| 15 | චෝදනාපත්‍ර නිකුත්කිරීම් | 33 |
| 16 | චෝදනාපත්‍ර සංශෝධනය කිරීම් | 8 |
| 17 | වැඩ තහනම් කිරීම් | 3 |
| 18 | විනය ක්‍රියාමාර්ගයෙන් නිදහස් කිරීම් | 7 |
| 19 | සෙසු විනය දඬුවම් | 24 |
| 20 | විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වීම් | 1 |
| 21 | නැවත සේවයේ පිහිටුවීම් | 14 |
| 22 | විනය ක්‍රියාමාර්ග අවසන් කිරීම් | 4 |
| 23 | විධිමත් විනය ක්‍රියාමාර්ග සඳහා නිලධාරීන් පත්කිරීම | 37 |
| 24 | විනය කටයුතුවලට අදාළ වෙනත් නියෝග | 69 |
| | එකතුව | 12916 |

**වගුව අංක 21**

## සෞඛ්‍ය සේවා කමිටුවේ ප්‍රගතිය
## (2017.01.01 – 2017.12.31)




**රූප සටහන අංක 07**

## 8 මුදල් ප්‍රතිපාදනය

2017.01.01 දින සිට 2017.12.31 දින දක්වා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ වියදම් සාරාංශය පහත පරිදි වේ.

| | ප්‍රතිපාදන | වියදම | ඉතිරිය |
|---|---|---|---|
| පුනරාවර්තන | 197, 113, 000.00 | 184, 170, 503.05 | 12, 942, 496.95 |
| ප්‍රාග්ධන | 254, 500, 000.00 | 160, 766, 909.61 | 93, 733, 090.39 |
| එකතුව | 451, 613, 000.00 | 344, 937, 412.66 | 106, 675, 587.34 |

**වගුව අංක 22**

## 9. කාර්ය මණ්ඩලය

### 9.1 සංවිධාන සටහන

සංවිධාන සටහන සඳහා ඇමුණුම 03 බලන්න.

### 9.2 කාර්ය මණ්ඩල සංයුතිය

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය නිලධාරීන් 227 කින් සමන්විත වූ අතර එම කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය සත්‍ය වශයෙන්ම සේවයේ යොදවන ලද කාර්ය මණ්ඩලය 189 ක් විය. එහි කාර්ය මණ්ඩලයේ සංයුතිය පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

**කාර්ය මණ්ඩල විස්තර**

| තනතුර | නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|
| ලේකම් | 01 |
| අතිරේක ලේකම් | 01 |
| කමිටු ලේකම් | 02 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 07 |
| සහකාර ලේකම් | 24 |
| ගණකාධිකාරී | 02 |
| පරිපාලන නිලධාරී | 02 |
| භාෂා පරිවර්තක | 03 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 01 |
| තොරතුරු තාක්ෂණ සහකාර | 01 |

| | |
|---|---|
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 99 |
| රියදුරු | 13 |
| කාර්යාල සේවක | 33 |
| **එකතුව** | **189** |

**වගුව අංක 23**

### 9.3 කාර්ය මණ්ඩල පුහුණු කටයුතු

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන්ගේ විෂය දැනුම, භාෂා ප්‍රවීනතාවය, තාක්ෂණික දැනුම හා විශේෂ කළමනාකරණ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා විවිධ පුහුණු වැඩසටහන්වලට සහභාගී වීමේ අවස්ථාව 2017 වර්ෂය තුළද ආයතනය මගින් ලබා දීමට කටයුතු කර ඇත.

| ශ්‍රේණිය | දේශීය | විදේශීය |
|---|---|---|
| මාණ්ඩලික නිලධාරීන් | 07 | 07 |
| මාණ්ඩලික නොවන නිලධාරීන් | 05 | ---- |

**වගුව අංක 24**

### 10. 2017 වර්ෂය තුළ එක් එක් අංශය විසින් කරුණු ඉදිරිපත් කර ඇති නඩු ගණන

| අංශය | ශ්‍රේෂ්ඨාධිකරණය | අභියාචනාධිකරණය | පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය |
|---|---|---|---|
| ආයතන | 76 | 11 | 40 |
| පත්කිරීම් | 39 | 14 | 113 |
| උසස්කිරීම් | 43 | 05 | 79 |
| විනය | 08 | 10 | 134 |
| අභියාචනා | 47 | 08 | 245 |
| අධ්‍යාපන සේවා කමිටුව | 02 | ---- | --- |
| **එකතුව** | **215** | **48** | **611** |

**වගුව අංක 25**

### 11. කොමිෂන් සභා රැස්වීම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2017.01.01 දින සිට 2017.12.31 දින දක්වා වූ සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ කොමිෂන් සභා රැස්වීම් 95 ක් පවත්වා ඇත.

## 12. අමාත්‍යාංශමය හා දෙපාර්තමේන්තුමය රැස්වීම්

සේවාලාභීන් වෙනුවෙන් ආයතනයේ අංශවලින් ඉටුවන කාර්යයන් වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා පහත සඳහන් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සමග රැස්වීම් පැවැත්වීමටත් ඒ මගින් ගැටළු නිරාකරණය කර ගනිමින් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීමටත් කටයුතු කර ඇත.

| අනු අංකය | දිනය | කාරණය | සහභාගී වූ දෙපාර්තමේන්තු / අමාත්‍යංශ/ආයතන |
|---|---|---|---|
| 01 | 2017.01.11 | ශ්‍රී ලංකා වෛද්‍ය සේවයේ ස්ථාන මාරු | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |
| 02 | 2017.01.18 | ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපති තනතුරට උසස්කිරීම | දුම්රිය දෙපාර්තමේන්තුව |
| 03 | 2017.01.24 | ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ 1 ශ්‍රේණියේ තනතුරු සම්පූර්ණ කිරීම | නිපුනතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය<br><br>කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව |
| 04 | 2017.01.25 | අතිරේක ලේකම් තනතුරට පත්කිරීම | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |
| 05 | 2017.02.21 | SC (FR) 276/2016 නඩුවට අදාළ කරුණු | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය<br><br>තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය<br><br>ජාතික උද්භිත උද්‍යාන දෙපාර්තමේන්තුව |
| 06 | 2017.02.27 | තැපැල් අධිකාරී උසස්වීමට අදාළ සම්මුඛ පරීක්ෂණය | තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය |
| 07 | 2017.02.28 | නව සේවා ව්‍යවස්ථාවන්හී අන්තර්කාලීන විධිවිධාන සම්බන්ධ ගැටළු | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය |
| 08 | 2017.03.06 | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවා ව්‍යවස්ථාවේ ගැටළු | ඉඩම් අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| 09 | 2017.03.16 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ මෝටර්රථ පරීක්ෂක විශේෂ පන්තියට උසස් කිරීම | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය<br><br>මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව |
| 10 | 2017.03.23 | • ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ උසස්වීම් ලබා දීම<br><br>• ගුරු විද්‍යාල සහ විද්‍යා පීඨයන්ට අනුයුක්තව සේවය කරන කථිකාචාර්යවරුන් ස්ථිර කිරීම<br>• විශ්‍රාම වැටුප් සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව වෙතින් විමසීම<br><br>• ශ්‍රී ලංකා විදුහල්පතිසේවයේ සේවා කාලය තීරණය කිරීම<br><br>• ජාතික පාසැල් විදුහල්පතිවරු පත්කිරීම සඳහා සංචිතයක් ඇති කිරීම<br><br>• නිලධාරීන් පූර්ණකාලීනව වැඩ බැලීම සඳහා පත්කිරීම<br><br>• ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය සඳහා තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය<br><br>• උතුරුමැද පළාත් උසස් පෙළ ගුරුවරු බඳවා ගැනීම<br><br>• ජාතික පාසැල්වල ස්ථාන මාරු කරන ලද විදුහල්පතිවරු සම්බන්ධ සාධාරණීකරණ වාර්තා<br><br>• ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන විශේෂ ශ්‍රේණියේ තනතුරු | අධ්‍යාපන අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| 11 | 2017.03.24 | දුම්රිය ලිපිකාර සේවයේ අධි පන්තියට උසස් කිරීම | දුම්රිය දෙපාර්තමේන්තුව |
| 12 | 2017.03.31 | විධායක නිලධාරීන් උසස් කිරීම | ශ්‍රී ලංකා රේගුව |
| 13 | 2017.04.06 | දුම්රිය එන්ජින් රියදුරු විශේෂ ශ්‍රේණියට උසස් කිරීම | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය<br><br>දුම්රිය දෙපාර්තමේන්තුව |
| 14 | 2017.05.02 | කාර්යක්ෂමතා කඩඉම්/ භාෂා ප්‍රවීනතාවය සඳහා සහන ලබාදීම | කෘෂිකර්ම අමාත්‍යාංශය |
| 15 | 2017.05.05 | ශ්‍රී ලංකා වෛද්‍ය සේවයට අදාළ කරුණු | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |
| 16 | 2017.05.05 | වාස්තු විද්‍යාඥ සේවයේ 1 ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය |
| 17 | 2017.05.05 | ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ තනතුරුවලට පත්කිරීමේදී ඇතිවී ඇති ගැටළු | ක්‍රීඩා අමාත්‍යාංශය<br><br>ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව<br><br>ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය |
| 18 | 2017.05.16 | ගුරු අධ්‍යාපනඥ සේවයේ ගැටළු | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 19 | 2017.05.22 | ඒකාබද්ධ තැපැල් සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ වැටුප් විෂමතා | තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය |
| 20 | 2017.05.22 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ 111 ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම<br><br>ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට නිලධාරීන් බඳවා ගැනීම<br><br>ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ 111 ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය |
| 21 | 2017.05.22 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය<br><br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| 22 | 2017.05.23 | සංවර්ධන නිලධාරී සේවයේ ගැටළු | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය |
| 23 | 2017.05.24 | කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කිරීම සඳහා සහන ලබා දීම | සමාජ සේවා දෙපාර්තමේන්තුව |
| 24 | 2017.05.25 | MN – 5 බඳවා ගැනීම් පටිපාටි ගැටළු | අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව |
| 25 | 2017.05.26 | සෞඛ්‍ය අමාත්‍යාංශයේ මහජන සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ නැවත ඉදිරිපත් කිරීම | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |
| 26 | 2017.05.30 | රජයේ අධිනීතිඥ නිලධාරීන් පරිවාස කාලය තුළ ලබාගත් විදේශ නිවාඩු සම්බන්ධ වැඩිදුර පැහැදිලි කිරීම් | අධිකරණ අමාත්‍යාංශය |
| 27 | 2017.06.02 | වෛද්‍ය පරිපාලනය සම්බන්ධ සාකච්ඡාව | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |
| 28 | 2017.06.02 | වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවට හා අතුරු වෛද්‍ය සේවාවට අයත් තනතුරුවල පුහුණු පාසැල්වලට ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් හා විදුහල්පතිවරුන් බඳවා ගැනීම | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |
| 29 | 2017.06.12 | දුම්රිය රියදුරු අධි පන්තියට උසස්වීම් ලබා දීම | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය<br><br>දුම්රිය දෙපාර්තමේන්තුව |
| 30 | 2017.06.20 | සිංහල ශබ්දකෝෂ කාර්යාලයේ සහකාර කර්තෘ තනතුර දරණ නිලධාරීන් 11 ශ්‍රේණියට උසස් කිරීම | අභ්‍යන්තර කටයුතු වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය |
| 31 | 2017.06.29 | දුම්රිය එන්ජින් රියදුරු විශේෂ ශ්‍රේණියට උසස් කිරීම | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය<br><br>දුම්රිය දෙපාර්තමේන්තුව |
| 32 | 2017.06.29 | දුම්රිය දෙපාර්තමේන්තුවේ බඳවා ගැනීම් පටිපාටි හා අනෙකුත් ගැටළු | අග්‍රාමාත්‍ය කාර්යාලය<br><br>රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය<br><br>ප්‍රවාහන හා සිවිල් ගුවන් |

| | | | |
|---|---|---|---|
| | | | සේවා අමාත්‍යාංශය<br>දුම්රිය දෙපාර්තමේන්තුව |
| 33 | 2017.06.29 | කෘෂිකර්ම සේවයේ 1 හා විශේෂ ශ්‍රේණියේ තනතුරුවලට පත්කිරීම | කෘෂිකර්ම අමාත්‍යාංශය<br><br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 34 | 2017.07.10 | භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | ජාතික සහජීවන, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය |
| 35 | 2017.07.12 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා සහන ලබා දීම | කෘෂිකර්ම අමාත්‍යාංශය |
| 36 | 2017.07.17 | ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුගත තාක්ෂණික නොවන බණ්ඩ - 11 තනතුරට අන්තර්ග්‍රහණය කිරීමේ සහ උසස් කිරීමේ පටිපාටිය අනුමත කර ගැනිම | නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය |
| 37 | 2017.07.18 | ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරින්ගේ විශ්‍රාම ගැන්වීමේ කාලය අවුරුදු 61 දක්වා දීර්ඝ කිරීම, පත්වීම් ලිපියේ 6 වන වගන්තිය සංශෝධනය | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය |
| 38 | 2017.07.25 | බන්ධනාගාර නියාමක තනතුරට බඳවා ගැනීම | බන්ධනාගාර හා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය |
| 39 | 2017.08.02 | තරුණ සංවර්ධන කටයුතු පිළිබඳ පළපුරුද්දක් ඇති තරුණ තරුණියන් ගුරු සේවයට බඳවා ගැනීම | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය<br><br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| 40 | 2017.08.08 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධරයන් උසස් කිරීම මත සීමිත පදනමින් ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ තනතුරවලට පත්කිරීම | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,<br><br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව<br><br>අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br><br>කාලගුණවිද්‍යා දෙපාර්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| | | | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 41 | 2017.08.10 | ගුරු සේවයට අදාළ ගැටළු සම්බන්ධව සාකච්ඡාව | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 42 | 2017.08.10 | • ජාතික පාසැල්වල පවතින පුරප්පාඩු වූ විදුහල්පති තනතුරු සඳහා නිලධාරීන් පත්කිරීම<br>• ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ සේවක සංඛ්‍යාව<br>• ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 43 | 2017.08.24 | රේගු දෙපාර්තමේන්තුවේ පවතින ගැටළු | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය |
| 44 | 2017.08.31 | මිනින්දෝරු සේවයේ නිලධාරීන්ගේ ගැටළු | ඉඩම් අමාත්‍යාංශය |
| 45 | 2017.09.06 | විද්‍යාත්මක සේවයට අදාල ඒඒටී/124/2016 අභියාචනය | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 46 | 2017.09.08 | ආගම විෂය ඉගැන්වීම සඳහා ධර්මාචාර්ය සමතුන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 – 11 ශ්‍රේණියට බඳවා ගැනිම | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 47 | 2017.09.18 | ඒකාබද්ධ තැපැල් සේවයේ අ ඛණ්ඩයේ 111 ශ්‍රේණියේ අ ඛණ්ඩයට අයත් නිලධාරීන් සඳහාවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය |
| 48 | 2017.09.28 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ 111 ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම - විවෘත (ව්‍යුහගත ලකුණු පටිපාටිය සම්බන්ධව) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය |
| 49 | 2017.09.28 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාව 2006.01.01 දිනට පෙරදාතම් කිරීම | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය |
| 50 | 2017.10.10 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක තනතුරේ විශේෂ පන්තියට උසස් කිරීම | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| | | (විභාග ප්‍රතිඵල මත) | |
| 51 | 2017.10.12 | • ගැටළු පැවති ජාතික පාසැල් විදුහල්පතිවරුන් සම්බන්ධව<br>• ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 පන්තියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය<br>• ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 පන්තියට බඳවා ගැනීම<br>• ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 පන්තියේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 52 | 2017.10.13 | ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ 11 පන්තියේ උසස්වීම ලබා දීම සම්බන්ධයෙන්වන ගැටළු නිරාකරණය කිරීම | නිපුනතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය |
| 53 | 2017.10.16 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ජනපද නිලධාරී විශේෂ පන්තියට උසස් කිරීම | ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය |
| 54 | 2017.11.17 | කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා සහන ලබා දෙන ලෙස ඉල්ලීම | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |
| 55 | 2017.11.20 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා නිලධාරීන්ට සහන ලබා දීම සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම | ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව |
| 56 | 2017.11.24 | ආයතන අංශයට අදාළව මෙතෙක් නිම නොවූ කරුණු | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |
| 57 | 2017.12.05 | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන 1 ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සම්බන්ධ ගැටළු | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය |
| 58 | 2017.12.11 | පුරප්පාඩුව පවතින අධ්‍යක්ෂ (දේශගුණ විපර්යාස) තනතුර සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් නිලධාරීන් | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| | | බඳවා ගැනීම | |
| 59 | 2017.12.14 | කේ.ඩී.ඩී. සරත් කුමාර මහතාට අදාළ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාර තීරණය ක්‍රියාත්මක කිරීම | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය<br><br>ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය |
| 60 | 2017.12.15 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ පන්තියට උසස් කිරීම | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව |
| 61 | 2017.12.19 | • ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට සීමිත පදනම මත බඳවා ගැනීම<br>• ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ උසස්වීම් ලබා දීමේදී විශේෂ සේවක සංඛ්‍යාවේ නිලධාරීන්ට සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ තනතුරු ලබා දීම<br>• ජාතික පාසැල් විදුහල්පතිවරුන් ස්ථාන මාරු කිරීම<br>• ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 62 | 2017.12.28 | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා සීමිත බඳවා ගැනීම යටතේ පැවති සම්මුඛ පරීක්ෂණය | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය<br><br>රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව |

**වගුව අංක 26**

## 13. ස්තුතිය

සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉටුකරන ලද බොහෝ සුවිශේෂ කටයුතු වලදී සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ද, දෙපාර්තමේන්තු ප්‍රධානීන් ද, විශේෂයෙන් ,

- ජනාධිපති ලේකම් කාර්යාලය
- අග්‍රාමාත්‍ය කාර්යාලය
- අමාත්‍ය මණ්ඩල කාර්යාලය
- රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
- ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව
- තොරතුරු හා සංනිවේදන තාක්ෂණ නියෝජිතායතනය
- නීතිපති දෙපාර්තමේන්තුව හා
- රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලය ද

දක්වනු ලැබූ අනුබලය හා දායකත්වය වෙනුවෙන් කොමිෂන් සභාවේ කෘතවේදීත්වය මෙහිලා විශේෂයෙන් සනිටුහන් කළ යුතු වේ.

| | |
|---|---|
| ඩී. දිසානායක මහතා | සභාපති |
| ඩී. එස්. විජයතිලක මහත්මිය | සාමාජික |
| ආචාර්ය පී. රාමනුජම් මහතා | සාමාජික |
| ඩී.ජෙගරාසසිංගම් මහත්මිය | සාමාජික |
| එස්.එන්. සෙනෙවිරත්න මහතා | සාමාජික |
| එස්. රනුග්ගේ මහතා | සාමාජික |
| ඩී එල් මෙන්ඩිස් මහතා | සාමාජික |
| එස්.ඒ.සී.එස්.ඩබ්ලිව්.ජයතිලක මහතා | සාමාජික |
| මහාචාර්ය ඒ.ජී. හුසයින් ඉස්මායිල් මහතා | සාමාජික |

ඇමුණුම 01

## සමාලෝචිත වර්ෂය තුළ මාණ්ඩලික නිලධාරීන් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණවලට එරෙහිව ඉදිරිපත් කළ අභියාචනා

### පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත ඉදිරිපත්ව තිබූ පැමිණිලි

| 2017.01.01 දිනට නිම නොවී තිබූ පැමිණිලි සංඛ්‍යාව | 2017 වසර තුළ ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | 2017.12.31 දිනට ලැබී තිබූ මුළු පැමිණිලි සංඛ්‍යාව | රා.සේ.කො. තීරණ සනාථ කළපැමිණිලි සංඛ්‍යාව | රා.සේ.කො. තීරණ අවලංගු කළ පැමිණිලිසංඛ්‍යාව | 2017.12.31 දිනට නිම නොවූ පැමිණිලිසංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 290 | 61 | 351 | 23 | 15 | 313 |

### ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කර තිබූ නඩු

| 2017.01.01 දිනට නිම නොවී තිබූ නඩු සංඛ්‍යාව | 2017 වසර තුළ ලැබුණු නඩු සංඛ්‍යාව | 2017.12.31 දින වන විට ලැබුණු මුළු නඩු සංඛ්‍යාව | ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිෂ්ප්‍රභා කළ නඩු සංඛ්‍යාව හා රා.සේ.කො. තීරණයට එකඟ වූ නඩු සංඛ්‍යාව | ශ්‍රේෂ්ඨාධිකරණය විසින් රා.සේ.කො. තීරණය අවලංගු කළ සංඛ්‍යාව | 2017.12.31 දිනට නිම නොවූ නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 129 | 42 | 171 | 14 | 01 | 156 |

### අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කර තිබූ නඩු

| 2017.01.01 දිනට නිම නොවී තිබූ නඩු සංඛ්‍යාව | 2017 වසර තුළ ලැබුණු නඩු සංඛ්‍යාව | 2017.12.31 දින වන විට ලැබුණු මුළු නඩු සංඛ්‍යාව | අභියාචනාධිකරණය විසින් රා.සේ.කො. තීරණය සනාථ කළ සංඛ්‍යාව | අභියාචනාධිකරණය විසින් රා.සේ.කො. තීරණය අවලංගු කර සහන සැලසූ සංඛ්‍යාව | 2017.12.31 දිනට නිම නොවූ අභියාචනාධිකරණ නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 36 | 04 | 40 | 01 | 01 | 38 |

- ඉහත අභියාචනාවලට අමතරව 2017.01.01 – 2017.12.31 කාලය තුළ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත පැමිණිලි 12 ක් යොමුකර තිබුණි.
- 2017.01.01 – 2017.12.31 කාලය තුළ මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර තිබූ පැමිණිලි සංඛ්‍යාව 09 ක් වන අතර එම පැමිණිලි සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වාර්තා යවා ඇත.
- 2017.01.01 – 2017.12.31 කාලය තුළ මහජන පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් කර තිබූ පැමිණිලි 14 ක් සඳහා කටයුතු කර ඇත.

ඇමුණුම 02

**සමාලෝචිත වර්ෂය තුළ මාණ්ඩලික නොවන නිලධාරීන් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණවලට එරෙහිව ඉදිරිපත් කළ අභියාචනා**

**පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත ඉදිරිපත්ව තිබූ පැමිණිලි**

| 2017.01.01 දිනට නිම නොවී තිබූ සංඛ්‍යාව | 2017 වසර තුළ ලැබුණු සංඛ්‍යාව | 2017.12.31 දිනට ලැබී තිබූ මුළු සංඛ්‍යාව | රා.සේ.කො. තීරණ සනාථ කළ සංඛ්‍යාව | රා.සේ.කො. තීරණ අවලංගු කළ සංඛ්‍යාව | 2017.12.31 දිනට නිම නොවූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| **219** | **41** | **260** | **25** | **7** | **228** |

**ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කර තිබූ නඩු**

| 2017.01.01 දිනට නිම නොවී තිබූ නඩු සංඛ්‍යාව | 2017 වසර තුළ ලැබුණු නඩු සංඛ්‍යාව | 2017.12.31 දින වන විට ලැබුණු මුළු නඩු සංඛ්‍යාව | ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිෂ්ප්‍රභා කළ නඩු සංඛ්‍යාව හා රා.සේ.කො. තීරණයට එකඟ වූ නඩු සංඛ්‍යාව | ශ්‍රේෂ්ඨාධිකරණය විසින් රා.සේ.කො. තීරණය අවලංගු කළ සංඛ්‍යාව | 2017.12.31 දිනට නිම නොවූ නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 29 | 19 | 48 | 7 | --- | 41 |


**අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කර තිබූ නඩු**

| 2017.01.01 දිනට නිම නොවී තිබූ නඩු සංඛ්‍යාව | 2017 වසර තුළ ලැබුණු නඩු සංඛ්‍යාව | 2017.12.31 දින වන විට ලැබුණු මුළු නඩු සංඛ්‍යාව | අභියාචනාධිකරණය විසින් රා.සේ.කො. තීරණය සනාථ කළ සංඛ්‍යාව | අභියාචනාධිකරණය විසින් රා.සේ.කො. තීරණය අවලංගු කර සහන සැලසූ සංඛ්‍යාව | 2017.12.31 දිනට නිම නොවූ අභියාචනාධිකරණ නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 03 | 05 | 08 | 03 | ---- | 05 |

- 2017.01.01 - 2017.12.31 කාලය තුළ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත නඩු 03 ක් ඉදිරිපත් කර ඇත.
- සමාලෝචිත කාලය තුළ මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි 03 ක් ඉදිරිපත් කර ඇත.
- 2017.01.01 - 2017.12.31 කාලය තුළ මහජන පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් වූ පැමිණිලි සංඛ්‍යාව 24 කි.

ඇමුණුම 03

# සංවිධාන සටහන
# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය




අති.ලේ - අතිරේක ලේකම්
ජ්‍ය.ස.ලේ. - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
ස.ලේ - සහකාර ලේකම්